

# වවුනියා හා මුලතිවු අධ්‍යාපන කලාපයේ නිදහස් අධ්‍යාපන සේවා පිළිබඳ පුරවැසි වාර්තා පත් සමීක්ෂණය



## පුරවැසි වාර්තා පතක්

2014 නොවැම්බර්


දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය

cepa

centre for poverty analysis

# වවුනියා හා මුලතිවු අධ්‍යාපන කලාපයේ
# නිදහස් අධ්‍යාපන සේවා පිළිබඳ පුරවැසි වාර්තා පත් සමීක්ෂණය

බාසිත් ඉනදීන්, මෙහලා මහිල්රාජා සහ කේ. රොමේෂන්

cepa
centre for poverty analysis

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය**

2014 නොවැම්බර්

මෙම ලේඛනය යුරෝපා සංගමයේ සහ සංවර්ධන සහයෝගය පිළිබඳ වූ ස්විස් නියෝජිත ආයතනයේ මූල්‍ය සහාය ඇතුව සකස් කරන ලද්දකි. මෙම ලේඛනයේ අන්තර්ගතයන් පිළිබඳ සම්පූර්ණ වගකීම CEPA සතු වන අතර මෙය කුමන අවස්ථාවකදී වත් යුරෝපා සංගමයේ සහ සංවර්ධන සහයෝගය පිළිබඳ වූ ස්විස් නියෝජිත ආයතනයේ තරාතිරමෙහි පරාවර්තනයක් සේ සැලකිය නොහැක.

## කෙටි යෙදුම් හා සංකේතනාම

| | | |
|---|---|---|
| ACTED | - | තාක්ෂණික සහයෝගය සහ සංවර්ධනය පිළිබඳ වූ නියෝජිත ආයතනය |
| ADE | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක |
| CEPA | - | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| CSO | - | සිවිල් සමාජ සංවිධානය |
| CRC | - | පුරවැසි වාර්තා පත |
| CLAPP | - | සිවිල් සමාජ සංවිධානය - ප්‍රාදේශික පාලන මණ්ඩල කාර්ය හා හවුල් වැඩ සටහන |
| DoE | - | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| DS | - | ප්‍රාදේශීය ලේකම් |
| GN | - | ග්‍රාම නිලධාරී |
| MoE | - | අධ්‍යාපන අමාත්‍යාංශය |
| MoH | - | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| NFE | - | අවිධිමත් අධ්‍යාපනය |
| PDE | - | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක |
| PAC | - | මහජන කටයුතු කේන්ද්‍රය |
| RDS | - | ග්‍රාම සංවර්ධන සමිතිය |
| SSO | - | සමාජ සේවා නිලධාරියා |
| SDC | - | සංවර්ධන සහයෝගය පිළිබඳ වූ ස්විස් නියෝජිත ආයතනය |
| WRDS | - | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| ZEO | - | කලාපීය අධ්‍යාපන කාර්යාලය |

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA), දිළිඳු බව හා අදාළ සංවර්ධන ගැටලු වඩා හොඳින් වටහා ගැනීමට අනුබල දෙන ස්වාධීන ශ්‍රී ලාංකීය බුද්ධිමණ්ඩලයකි. දිළිඳුකම යනු පරාජය කළ යුතු අයුක්තියක් යැයි CEPA විශ්වාස කරන අතර, ජාතික වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති සහ චත් පිළිවෙත් වෙනස් කිරීම මෙන්ම, දිළිඳු බවෙන් පෙලෙන්නන් සමඟ ක්‍රියා කිරීම ද දිළිඳුකම පරාජය කිරීම සඳහා අවශ්‍ය වේ. CEPA තුළ අප අවධාරණය දක්වන්නේ ස්වාධීන විශ්ලේෂණය, සංවර්ධන කාරකයන්ගේ හැකියාවන් වර්ධනය, හා ප්‍රතිපත්ති බල පැවැත්වීම සඳහා අවස්ථාවන් සෙවීම සඳහාය. අප අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වන අතරතුර නොකැඩුණු ආනුභවික සාක්ෂි සහිත සේවා සැපයුමක් උදෙසා ශක්තිමත් හැඩගැස්මකින් බලපෑම් ලද්දෝය. සේවාලාභියන්ගේ ඉල්ලීම් හරහා CEPA මෙම අවශ්‍යතාවේ හැඩගැස්ම පවත්වාගෙන යන අතරතුර, පුළුල් තේමාත්මක වර්ගඵලයන් පහක් පදනම් කොටගෙන මීට සමාන්තර ස්වාධීන පර්යේෂණ වැඩ සටහනක් පසුපස හඹා යයි: පශ්චාත් ගැටුම් සංවර්ධනය, අන්තරා ඇති වීමේ ප්‍රවණතාව, සංක්‍රමණය, යටිතල ව්‍යුහ හා පරිසරය. අවසානයේ දී, CEPA උත්සාහ දරන්නේ ජාතික, කොට්ඨාසික, කේන්ද්‍රික, වැඩසටහන් හා ව්‍යාපෘති මට්ටමින් දිළිඳු බව හා අදාළ සංවර්ධන ප්‍රතිපත්තියන්ට බලපෑම් ඇති කිරීම සඳහා දායකත්වය දැරීමටය.

අධ්‍යයනය පවත්වනු ලැබුවේ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ බාසිත් ඉනදීන්, මෙහාලා මහිල්රාජා සහ රොමේෂන් විසිනි.

ඉන්දීන්, බාසිත්
වවුනියා සහ මුලතිව් අධ්‍යාපන කලාපයේ නිදහස් අධ්‍යාපන සේවා පිළිබඳ පුරවැසි වාර්තා පත් සමීක්ෂණය / බාසිත් ඉන්දීන්, මෙහලා මහිල්රාජා සහ කේ. රෝමේෂන් .- කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2015
පි. 63 ; සෙමී. 29

ISBN 978-955-1040-86-4

i. 370.95493072 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය
iii. මහිල්රාජා, මෙහලා සම කර්තෘ. iv. රෝමේෂන්, කේ. සම කර්තෘ.

1. අධ්‍යාපනය - ශ්‍රී ලංකාව - පර්යේෂණ
2. නිදහස් අධ්‍යාපනය - ශ්‍රී ලංකාව - පර්යේෂණ
3. ග්‍රාමීය අධ්‍යාපනය - ශ්‍රී ලංකාව - පර්යේෂණ

# ස්තුතිය

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් මෙම අධ්‍යයනය සඳහා සහයෝගය දැක්වූ යුරෝපීය සමිතිය හා සංවර්ධන සහයෝගය පිළිබඳ වූ ස්විස් නියෝජිත ආයතනයට (SDC) කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමු. මෙම අධ්‍යයනය බාරගනු ලැබුවේ සිවිල් සමාජ සංවිධානය - ප්‍රාදේශික පාලන මණ්ඩල කාර්යය හා හවුල් වැඩ සටහනේ (CLAPP) අංගයක් වශයෙනි. මෙහිදී CEPA විසින් තාක්ෂණික සහයෝගය සහ සංවර්ධනය පිළිබඳ වූ නියෝජිත ආයතනයට (ACTED) හවුල දක්වන ලදී.

ඉන්දියාවේ බැංගලෝර් නගරයේ මහජන කටයුතු කේන්ද්‍රය (PAC) විසින් CRC සමීක්ෂණයේ නිර්මාණය හා හසුරුවීම සඳහා සහාය දැක්වූ අතර ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ බුද්ධිමණ්ඩල මුල් පිරුම මහින් තාක්ෂණික සහාය සඳහා අරමුදල් සපයන ලදී. මූලික අවධියේ දී අපට මග පෙන්වූ මීනා නෙයාර් සහ ප්‍රභාකර් කොල්ලපුඩි හට අපගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමු.

මුලතිවු සහ වවුනියා ප්‍රදේශීය ලේකම්වරුන් හා උතුරු මුලතිවු සහ වවුනියා හා දකුණු වවුනියා අධ්‍යාපන කලාප නිලධාරීන් ගේ සහාය ඔස්සේ මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීමට හැකිවිය.

මෙම වාර්තාව නිරීක්ෂණය කළ වෛද්‍ය ගෝපකුමාර් කේ. තම්පි, ආසියාතික පදනම සහ ප්‍රියන්ති ප්‍රනාන්දු මෙනෙවිය, CEPA හි එරංග අමුනුගම සහ රොෂ්නි අලස් හටද කෘතඥතාව හිමි විය යුතුය.

මුලතිවු හි අනුගණකයන් / සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින් ඒ. ආරියමලාර්, ඒ. ඇන්ටන්කුක්සා, ඊ. නාලායිනී, ඊ. විද්‍යාකරන්, ජේ. ජෙයක්කීත්තා, කේ. බකෙරාති, කේ. ශාර්මිලා, කේ. තනූෂියා, එම්. ඒ. ලතිප්, එම්. ජෙයවතන, එම්. සුබන්ති, එස්. ජගතීස්වරන්, එස්. ජයතීබන්, එස්. සුරේෂ්, ටී. රසලඩ්සුම්, වී. රජිවිනි හටද CEPA විසින් කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමු.

වවුනියාවේ අයි. ලෝගිනී, ජේ. මෙගලාදේවි, ජේ. පරසක්ති, කේ. රාසකුමාරි, එම්. ඒ. ජේ. මහේෂ්, එන්. කෝමතී, එන්. වනීතා, පී. කජීපන්, පී. කුමුතිනී, ආර්. ලෝගනායගී, ආර්. බවානිතේවි, එස්. අරුන්දවමලර්, එස්. පී. සුදර්ශන්, එස්. රානි, ටී. සරස්වතී, යූ. සින්දූයා, ආර්. භාවනීදේවි.

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු සැපයූ සිසුන් හා දෙමාපියන් හට CEPA විසින් ඉතාමත්ම විශේෂයෙන් කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමු.

# පටුන

**විධායක සාරාංශය**

1. **අධ්‍යාපන සේවා සඳහා සැපයුමට පුරවැසි වාර්තා පත මෙහෙයවීම** .......... 1

1.1. **හැඳින්වීම** .......... 1

1.2. **අධ්‍යාපන සේවාවන් පමුණුව සඳහා මූලික පුරවැසි වාර්තා පත** .......... 2

2. **ශිෂ්‍යයන් හා දෙමාපියන්ගේ ප්‍රතිචාර පිළිබඳ විශ්ලේෂණය** .......... 3

2.1. **ලැබිය හැකි පාසල්, ප්‍රවේශ වීමේ හැකියාව හා භාවිතය** .......... 3

2.2. **අධ්‍යාපන පහසුකම් වල විශ්වාසනීයත්වය හා ගුණත්වය** .......... 4

2.2.1. **යටිතල ව්‍යුහයන්ගේ පහසුකම්** .......... 4

2.2.2. **ගුරුමණ්ඩලය** .......... 6

2.2.3. **ශිෂ්‍ය සුභසාධක සේවා** .......... 7

2.3. **අධ්‍යාපන සේවාවන් වෙත පිවිසීමට පවතින ගැටළු හෝ අපහසුතා** .......... 8

2.4. **සැඟවුණු ගාස්තු/අමතර වියදම්** .......... 11

2.5. **තෘප්තිතා මට්ටම්** .......... 12

2.6. **වැඩි දියුණුව සඳහා යෝජනා** .......... 15

3. **ප්‍රධානතම නිගමන** .......... 16

4. **කලාපීය අධ්‍යාපන කාර්යාලයන්ගේ ප්‍රතිචාරය** .......... 16

## ඇමුණුම්


ඇමුණුම 1: පුරවැසි වාර්තා පත ---------- 18
ඇමුණුම 2: CRC ගෘහස්ථ ප්‍රශ්නාවලිය ---------- 20
ඇමුණුම 3: පුරවැසි ලකුණු ගණන් පතින් සොයාගත් මූලික කරුණු සඳහා කාර්ය සැලසුම - අධ්‍යාපන සේවා පමුණුව සඳහා සමීක්ෂණය - මුලතිවු අධ්‍යාපන කලාපය ---------- 47
ඇමුණුම 4: පුරවැසි ලකුණු ගණන් පතින් සොයාගත් මූලික කරුණු සඳහා කාර්ය සැලසුම - අධ්‍යාපන සේවා පමුණුව සඳහා සමීක්ෂණය - දකුණු වවුනියා අධ්‍යාපන කලාපය ---------- 49


## වගු


වගුව 1: පාසැල් නොපැමිණීමට හේතු (වයස අවු. 6-18) ---------- 3
වගුව 2: අධ්‍යාපනයේ ප්‍රයෝජනය සමීප වශයෙන් ---------- 4
වගුව 3: ගොඩනැගිල්ලේ/පංති කාමරයේ පහසුකම් ප්‍රමාණවත්කම (හෝ අඩුව) ශිෂ්‍යයන් වාර්තා කිරීම ---------- 5
වගුව 4: පුස්තකාල සහ පරීක්ෂණාගාර පහසුකම් ---------- 5
වගුව 5: ප්‍රමාණවත් ජල හා වැසිකිළි පහසුකම් ---------- 5
වගුව 6: ක්‍රීඩා පහසුකම් ---------- 5
වගුව 7: වෛද්‍ය පහසුකම් ---------- 5
වගුව 8: කෑම ---------- 7
වගුව 9: රජයෙන් සපයන ප්‍රතිපාදන ---------- 8
වගුව 10: ගැටළු හෝ අපහසුතා ---------- 8
වගුව 11: වෙනස්කම් සිදුකිරීම ---------- 8
වගුව 12: දඬුවම් ---------- 9
වගුව 13: අවස්ථා ---------- 10
වගුව 14: ගාස්තු/පාසැලට ගෙවීම් ---------- 12
වගුව 15: වාර්ෂික මහා සභා රැස්වීම් ---------- 12
වගුව 16: අධ්‍යාපන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යයන්ගේ හා දෙමාපියන්ගේ යෝජනා ---------- 15


## රූප සටහන්


රූපය 1: ගුරුමණ්ඩලය ---------- 6
රූපය 2: ශිෂ්‍යයන්/දෙමාපියන් හා පාසැල් කාර්ය මණ්ඩලය අතර සබැඳියාව ---------- 7
රූපය 3: ගැටළු නිරාකරණය ---------- 10
රූපය 4: ගැටළු වාර්තා කරණුයේ ---------- 11
රූපය 5: පහසුකම් සමග තෘප්ති මට්ටම - ශිෂ්‍යයන් වාර්තා කරන "සම්පූර්ණ තෘප්තිතාවය" ---------- 13
රූපය 6: ඉගැන්වුම සමග තෘප්ති මට්ටම - ශිෂ්‍යයන් වාර්තා කරන "සම්පූර්ණ තෘප්තිතාවය" ---------- 13
රූපය 7: ගුරුවරුන් සමග අන්තර් ක්‍රියා - ශිෂ්‍යයන් හා දෙමාපියන් වාර්තා කරන "සම්පූර්ණ තෘප්තිතාවය" ---------- 14
රූපය 8: සමස්ත තෘප්තිතාවය ---------- 15

# විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ දිළිඳු කමින් මිදීම සඳහා අධ්‍යාපනය ප්‍රධාන තැනක් ගනී. උතුරු හා නැගෙනහිර පළාතට මහත් සේ බලපෑමක් ඇති කළ දශක තුනක් ඔස්සේ වූ යුද්ධය හේතුවෙන් අධ්‍යාපන පහසුකම් ඇතුළු යටිතල ව්‍යුහයන් බොහෝමයක් විනාශ වූහ. ශ්‍රී ලාංකීය රජය විසින් උතුරු සහ නැගෙනහිර පළාත්වල අධ්‍යාපනය හා අනෙකුත් පහසුකම් සඳහා මහත් සේ ආයෝජනය කරන නමුදු, අධ්‍යාපන පහසුකම් පිළිබඳ වන සේවයන් මෙම අංශයෙන් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ප්‍රධාන තැනක් ගනී.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් පුරවැසි වාර්තා පත (CRC) ආශ්‍රිතයෙන් මුලතිවු දිස්ත්‍රික්කයට අයත් මුලතිවු අධ්‍යාපන කලාපයේ සහ වවුනියා දිස්ත්‍රික්කයට අයත් උතුරු හා දකුණු අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන සේවාවන් වැඩි දියුණු කිරීමට සහාය වීමට අදාළ බලධාරීන් හට භාවිත දෘෂ්ටිකෝණයක් සැලසීම උදෙසා අධ්‍යාපන සේවයේ ගුණාත්මක භාවය පිළිබඳ තොරතුරු රැස් කරනා ලදී. මෙම ප්‍රශ්නාවලිය විසින් ප්‍රවේශ වීමේ දර්ශයන්, ගුණාත්මක භාවය හා විශ්වාසනීයත්වය, ගැටළු හා අපහසුතා, සැඟවුණු ගාස්තු/අමතර වියදම් සහ තෘප්ති මට්ටම් ආවරණය කරන ලදී. මෙම සමීක්ෂණය මගින් මෙම අධ්‍යාපන කලාපයන්ට අයත් ගෘහයන් 802 ක් ආවරණය වූ අතර සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබුයේ එම ගෘහයන්හි පාසැල් යන දරුවෙකු හා මාපිය දෙදෙනා සමඟය.

උතුරු පළාතේ සිදු වූ ගැටුම් මගින් වවුනියාව අඩු බලපෑමක් ඇති වූ දිසාවක් වූයෙන් අධ්‍යාපන සේවාවන් සඳහා එහි සමස්ත වශයෙන් තෘප්ති මට්ටම වඩාත් ඉහළය (80%). මේ හේතුවෙන් ගැටීම් සිදු වූ වකවානුව තුළ වුව ද උතුරු පළාත් දිසාවන් අතරින් එහි අධ්‍යාපන පහසුකම් සඳහා ආයෝජනය කිරීමට හැකියාව තිබුනි. 2009 වසරේ දී යුද්ධයේ අවසන් ගැටුම් සිදු වූ මුලතිවු දිස්ත්‍රික්කයේ සිසුන් හා දෙමාපියන්, ඊට අඩු වූ තෘප්ති මට්ටමක් (63%) දැක්වූ අතර එය යටිතල ව්‍යුහ සහ සේවාවන් සංවර්ධනය සඳහා පරාවර්තනයක් දක්වන පළාතකි. මුලතිවු හි සිසුන්ට සාපේක්ෂව සිසුවියන් වඩාත් අඩු තෘප්ති මට්ටමක් වාර්තා කිරීම සැලකිල්ලට ගත යුතු කරුණක් වන අතර එය තව දුරටත් විමර්ශණයට ලක් කිරීම අවශ්‍ය වන්නේය.

දිස්ත්‍රික්ක දෙකේ අධ්‍යාපන සේවාවන් තක්සේරු කරන ලද්දේ දර්ශක කිහිපයක් පදනම් කොටගෙනය. අධ්‍යාපන යටිතල ව්‍යුහයන්, පාසැල් තුළ පහසුකම්, රජය විසින් සපයන ශිෂ්‍ය සුභසාධක පිහිටාධාර, ඉගැන්වීම් ගුණත්වය, සිසුන් හා දෙමාපියන් සමඟ පාසැල් කාර්යය මණ්ඩලයේ අන්තර් ක්‍රියා, පාසැල තුළ සිසු සංවර්ධනය සඳහා අවස්ථා, පාසැල තුළ සිසුන්ට ඇතිවන ගැටළු සහ එහි නිරාකරණය, ගාස්තු-සැඟවුණු ගාස්තු යනාදිය මෙම සේවාවන් අතරට ඇතුළත් වූහ.

උතුරු පළාතේ සිදු වූ ගැටුම් මගින් අඩු බලපෑමක් ඇති වූ දිසාවක් වූ හෙයින්, විශේෂයෙන්ම වවුනියා අධ්‍යාපන කලාපයේ (97%), බලාපොරොත්තු වූ පරිදි යටිතල ව්‍යුහ පහසුකම් පිළිබඳව අගය කොට සැලකීමක් සිදු විය. පංතිකාමර මදිපාඩුකම හේතුවෙන් මුලතිවු දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දක්වන්නන් විසින් සාපේක්ෂව අඩු වූ තෘප්ති මට්ටමක් (78%) දක්වනු ලැබීය. කෙසේ වුවත්, බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු වෙනත් පහසුකම් තිබීය. වවුනියා දිස්ත්‍රික්කය තුළ, ක්‍රීඩාපිටි පහසුකම් සඳහා මෙය ප්‍රධාන වශයෙන් අදාළ වන අතර, ප්‍රතිචාර දක්වන සිසුන්ගෙන් 7% පෙන්වා දෙන්නේ ක්‍රීඩාපිටියක් නොමැතිකම හේතුවෙන් පාසැල විසින් ක්‍රීඩා කටයුතු සංවිධානය නොකරන බවය. මුලතිවු දිස්ත්‍රික්කය තුළ මෙම ගැටළු අදාළ වනුයේ, පාසැල් තුළ පරිඝණක හා විද්‍යාගාර පහසුකම් සහ ජලයේ ගුණත්වය සම්බන්ධවය. ආබාධිත සිසුවන්ගේ පහසුකම් පිළිබඳව ද පාසැල් මගින් සලකා බැලීම සිදු කළ යුතුය. ආබාධිත තත්ත්වය හේතුවෙන් පාසැලට නොගිය සිසුන් සය (6) දෙනෙකුගෙන් පස් (5) දෙනෙකුම වාර්තා කරන්නේ ඔවුන් කවරදාකවත් පැසැල් නොගිය බවය.

විශේෂයෙන්ම දුප්පත් ළමුන්ගේ අධ්‍යාපනය උදෙසා වියදම් අවම කර සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා, රජය විසින් දිවා ආහාර වේලක්, පාසැල් නිල ඇඳුම් සඳහා නොමිලේ රෙදි හා පාඩම් පොත් ඇතුළු සුභසාධක ක්‍රියාමාර්ග කිහිපයක් සපයනු ලැබේ. මෙම සුභසාධක ක්‍රියාමාර්ගයන් සඳහා මහත් ඇගයීමක් පවතී.

ඒ කෙසේ වෙතත්, තම පාසැල්වල දිවා ආහාර වේල සපයන ක්‍රමවේදයක් නොපවතින බවට අඩක් පමණ සිසුන් දක්වන කරුණ පිළිබඳව වවුනියා බලධාරීන් සිහි තබාගත යුතුය.

ගුරුමණ්ඩලය සම්බන්ධයෙන්, දිස්ත්‍රික්ක දෙකේම සිසුන් දක්වන්නේ ඔවුන්ට තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි හා විද්‍යාව යන විෂයන් සඳහා ගුරුවරුන් නොමැති වගයි. සිසුවන් වැඩිම ප්‍රතිශතයක් (වවුනියාව හා සැසඳීමේ දී) විසින් සෑම විෂයක් සඳහාම ගුරුවරුන් සඳහා අඩුපාඩුවක් පවතින බව දක්වන හෙයින් ගුරුමණ්ඩලය වැඩි කිරීමේ අවශ්‍යතාවක් මුලතිවු දිස්ත්‍රික්කයේ පවතී. ඊට අමතරව, ගුරුවරුන්ගේ සංඛ්‍යාව (සිසුවන්ගේ තෘප්ති මට්ටම 73% සහ සිසුවියන්ගේ තෘප්ති මට්ටම 62%) හා ඉගැන්වීමේ ප්‍රමිතිය (සිසුවන්ගේ 75% සහ සිසුවියන්ගේ 70%) සම්බන්ධව මුලතිවු දිස්ත්‍රික්කයේ සිසුවියන් අඩු තෘප්ති මට්ටමක් වාර්තා කරන අතර සිසුවියන්ගේ අධ්‍යාපන ගුණත්වය තහවුරු කිරීම සඳහා පියවර ගැනීමක් අවශ්‍ය වේ.

සමීක්ෂණයට භාජනය වූ සිසුන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් දක්වන්නේ ඔවුන්ට පාසැල තුළ පැමිණිලි/ගැටළු ඇති වූ බවයි. නමුත් අදාළ බලධාරීන් හා ඒ පිළිබඳව සාකච්ඡා කරනු ලැබුවේ ගැටළු ඇති අයගෙන් හතරෙන් එකක් පමණි. පාසැලට කැළලක් නොවන පරිදි, පැමිණිලි කරන ලද/සාකච්ඡාවට ලක් වූ කරුණු බහුතරයක්ම තෘප්තිමත් විය හැකි අන්දමකට විසඳූ බවට වාර්තා විය. ගුරුවරුන්, දෙමාපියන් හා සිසුන් අතර අන්තර් ක්‍රියා සඳහා ක්‍රමවත් ක්‍රියාපිළිවෙතක් පවතී. මෙයින් ඉතාමත් ඉහළ ප්‍රතිශතයක් (95%) දක්වන්නේ ගුරු-දෙගුරු රැස්වීම් පාසැල් වාරයකට වරක්වත් පැවැත්විය යුතුවන බව හා, දෙමාපියන්ට හා සිසුන්ට ඇති ගැටළු හා පැමිණිලි පිළිබඳව සාකච්ඡා හා නිරාකරණයේ වර්ධනය සඳහා වේදිකාවක් නිර්මාණය කිරීමේ කටයුත්ත තහවුරු කිරීම උදෙසා මෙය තවත් ක්‍රමයක් විය හැකි බවයි.

සමීක්ෂණයට භාජනය වූ සිසුන්ගෙන් සියයට දහයක් පමණ දක්වන්නේ ඔවුන් වෙනස්කම් වලට මුහුණපාන බවයි. වෙනස්කම් සඳහා ප්‍රධාන හේතුව වශයෙන් වාර්තා වනුයේ අධ්‍යාපන මට්ටම් හා සිසුවන්ගේ හා ගුරුවරුන්ගේ ආර්ථික තත්ත්වයන්ය (53% ක් සිසුවන් විසින් වෙනස්කම් පිළිබඳව කරන ලද පැමිණිලි). වෙනස්කමට ලක්වන අය දක්වන්නේ ඔවුන්ට ඉන්පසුව සහෝදර සිසුවන් ඇතුළු අනෙක් අය විසින්ද වෙනස්කම් ඇතිවන බවයි. එම නිසා, ගුරුවරුන්ට මේ පිළිබඳව අවවාද දීමක් කළ යුතු වේ.

සිසුන් සියයට හතලිස් හතක් (47%), ප්‍රධාන වශයෙන්ම සිසුවන් (පිරිමි) විසින් පැමිණිලි කරන්නේ පාසැල තුළ පමුණුවන දඬුවම් පිළිබඳවය. ශාරීරික දඬුවම් පමුණුවීම පාසැලේ විනය රැකීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිතා කරන ක්‍රමවේදයක් වන අතර, මෙම භාවිතයේ තහනම පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ආඥාපත්‍රයන් ප්‍රධාන වශයෙන්ම උල්ලංඝනය කෙරෙනුයේ ගුරුවරුන් විසිනි.

පහසුකම්/වාර්ෂික ගාස්තුන් හැර වෙනත් අවශ්‍යතාවයන් සඳහා මුදල් එකතු කිරීම සුලබ වශයෙන් වාර්තාවන ලක්ෂණයකි. බොහෝ අවස්ථාවල දී මෙම ගාස්තු සඳහා කුවිතාන්සියක් නිකුත් නොකිරීම ඊට අදාළ වූ ගැටළුවකි. පංතියෙන් පිටතට හෝ ගෙදර යැවීම, ශාරීරික දඬුවම් පමුණුවීම හා විභාගයනට පෙනී සිටීමේ තහනම යනාදී බලකිරීම් ද මේ සඳහා සිදුකරනු ලැබේ.

මෙලෙස රජය විසින් යටිතල ව්‍යුහයන් සඳහා ආයෝජනය දක්වන අතර, අදාළ අධ්‍යාපන කලාපයන් තුළ සිටිනා සිසුන්ට අධ්‍යාපනය අත් කර ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ වර්ධනය කිරීමට ඉහත වාර්තා කරන පරිදි ක්‍රියා පිළිවෙළ සම්බන්ධ පවතින ගැටළු පිළිබඳව අධ්‍යාපන බලධාරීන් සිහි තබා ගත යුතුය.

# 1. අධ්‍යාපන සේවා සඳහා සැපයුමට පුරවැසි වාර්තා පත මෙහෙයවීම

## 1.1.හැඳින්වීම

2013 වසරේ ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය (HIES) මහින් පෙන්වා දෙන්නේ, අධ්‍යාපනය යනු දිළිඳුකමින් මිදීමේ මහක් සහ ආදායම්ලාභියාගේ ආදායම යනු ලබාගත් අධ්‍යාපනය හා ඉහළ ධනාත්මක සම්බන්ධතාවක් පවතින්නක් බවය. ඉහළ අධ්‍යාපන මට්ටම් මහින් ආහාර සඳහා අනාරක්ෂිතභාවය අවම කරනා අතර වත්කම් වර්ධනය කිරීමක් ඇතිකර එමහින් ගෘහස්ථ දුර්වලකම් අවම කිරීමක් ද සිදු වේ. නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා දසතින් දායකත්වය ලද සැපයුමක් ඔස්සේ, ශ්‍රී ලංකාව ඉහළ මානව සංවර්ධන මට්ටමකට අයිතිවාසිකම් දරයි. නමුත්, ශ්‍රී ලංකාවේ දශක තුනක් තිස්සේ වූ ආයුධ සන්නද්ධ ගැටීම් හේතුවෙන් උතුරු පළාතේ අධ්‍යාපනය හා දිවිපෙවෙත් සඳහා ඍණාත්මක බලපෑමක් ඇතිවී සැලකිය යුතු වෙනස්කම් රාශියක් ඇති විය. ඒ කෙසේ වෙතත්, උතුරු පළාතේ සෑම දිස්ත්‍රික්කයක් තුළම සංවර්ධනයේ සැලකිය යුතු විවිධ වෙනස්කම් ද පෙන්නුම් කරයි. වවුනියා දිස්ත්‍රික්කය දිගුකාලීන ගැටුම් සන්ධිය තුළ උතුරු පළාතට පිවිසුම් දොරකඩක් වූ හෙයින් ජනයාට හා ආධාර සැපයූ විවිධ සංවිධානයන්ට සරණක් සහ සංක්‍රමණ ස්ථානයක් වශයෙන් ක්‍රියා කළහ. මෙම ක්‍රියාකාරකම් සමූහය, බටහිර පළාත් දිස්ත්‍රික්කයන් හා කිට්ටුවෙන්ම සමව වවුනියාවේ 3.4 ක ඉතාමත් අඩු මට්ටමේ දිළිඳුකම් අනුපාතයක් ලේඛනගත කිරීමට දායක වූ බව සිතිය හැක. නමුත්, 2009 මැයි මාසයේ දී අවසන් ගැටුම් සිදු වූ මුලතිව් දිස්ත්‍රික්කය තුළ, එහි ජනගහනයෙන් සියයට 29 කට සමීප වූ සංඛ්‍යාවක් දිළිඳුකම් මට්ටමින් පහළටම වැටී ඇති බවට තක්සේරු කරනු ලැබ ශ්‍රී ලංකාවේ ඉහළම මට්ටමේ දිළිඳුකම් අනුපාතයක් ලේඛනගත විය.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද විමර්ශනයක් මහින් දක්වන්නේ, දිළිඳුකම් මට්ටමින් පහළ තතත්වයක සිටිනා වවුනියා ජනගහනය බටහිර පළාත් හා සම වූ නමුදු, එහි අධ්‍යාපන පද්ධතිය සඳහා ප්‍රමාණවත් වැඩි දියුණුවක් අවශ්‍ය වන බවය. 2010 සිට 2012 වසරයන් අතරතුර දී 35 කින් වර්ධනය වූ මුලතිව් දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී පාසැල්වල දක්නට ලැබෙනා පරිදි උතුරේ අධ්‍යාපන යටිතල ව්‍යුහයන් සඳහා අත්‍යවශ්‍ය අයෝජනයන් ශ්‍රී ලාංකීය රජය විසින් සැබැවින්ම සිදු කරනු ලැබේ. එහෙයින්, ඉදිරියට කරගෙන යමින් පවතින පාසැල් සඳහා අදාළ වූ සංවර්ධන වැඩකටයුතු සඳහා භාවිත දෘෂ්ටිකෝණයක් ඉදිරිපත් කිරීමට මෙය උචිත කාලයකි.

මුලතිවු හා වවුනියා දිස්ත්‍රික්කයන්ගේ තෝරාගත් අධ්‍යාපන කලාපයන් තුළ අධ්‍යාපන සේවා සැපයුම පිළිබඳ විපරම් කිරීම සඳහා එම දිස්ත්‍රික්කයන් තුළ භාවිත දෘෂ්ටිකෝණය ඉස්මතු කර ගැනීමට දිළිඳුකම් විශ්ලේෂණය පිළිබඳ වූ මධ්‍යස්ථානය දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් පුරවැසි වාර්තා පත භාවිතා කරන ලදී. විපරම් කිරීම මෙහි ස්වභාවය වූවත්, මෙම අභ්‍යාසය මහින් පරදු දරන්නන් තුළ දැනුවත්කම හා හැකියාව ගොඩනැංවීම පමණක් නොව, අධ්‍යාපන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා අදාළ නියෝජිත ආයතනයන්ට විනිශ්චය දර්ශක ලබා දීමක් ද සිදු වේ.

මෙම සමීක්ෂණයට මුල පුරනු ලැබුවේ සිවිල් සමාජ සංවිධානය - ප්‍රාදේශික පාලන මණ්ඩල කාර්යය හා හවුල් වැඩ සටහනේ (CLAPP) අංගයක් වශයෙන් හා දිස්ත්‍රික්ක ලේකම්වරුන් හා දිස්ත්‍රික්ක/ කලාපීය අධ්‍යාපන කාර්යාලයන් සමග එකහතාවක් ඇතුවය. යුරෝපීය සමිතිය හා සංවර්ධන සහයෝගය පිළිබඳ වූ ස්විස් නියෝජිත ආයතනයේ (SDC) අරමුදලින් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා CEPA විසින් තාක්ෂණික සහයෝගය සහ සංවර්ධනය පිළිබඳ වූ නියෝජිත ආයතනයට (ACTED) හවුල දක්වන ලදී. CRC සමීක්ෂණයේ නිර්මාණය හා හසුරුවීම සඳහා ඉන්දියාවේ බැංගලෝර් හි පිහිටි මහජන කටයුතු පිළිබඳ වූ පදනම (Public Affairs Centre-PAC-) විසින් CEPA ට සහාය සැපයූ අතර ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ බුද්ධිමණ්ඩල මුල් පිරුම මහින් තාක්ෂණික සහාය සඳහා අරමුදල් සපයන ලදී. ප්‍රශ්නාවලිය නිරීක්ෂණය, සංඛ්‍යාලේඛන සැපයුම හා ආරම්භක සොයා ගැනීම් තහවුරු කිරීම සඳහා ප්‍රායෝගිකව රැස්වීම් වලට සහභාගීවීම තුළින්, වවුනියා හා මුලතිවු දිස්ත්‍රික්කයන්හි කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා ඔවුන්ගේ කාර්යය මණ්ඩලය ආරම්භයේ සිටම මෙම සමීක්ෂණයට සම්බන්ධ විය.

## 1.2.අධ්‍යාපන සේවාවන් පමුණුව සඳහා මූලික පුරවැසි වාර්තා පත

CRC විසින් මහජන නියෝජිත ආයතනයන් හට සේවාවන්ගේ ගුණය පිළිබඳව භාවිතා කරන්නන්ගේ ක්‍රමවත් ප්‍රතිචාරයන් සපයනු ලැබේ. පොදු සේවාවන් වෙත පිවිසුමට පුරවැසියන් මුහුණපාන ප්‍රධානතම බාධක හඳුනා ගැනීම සඳහා එය ප්‍රයෝජනවත් වන අතර, සේවාවන්ගේ ගුණාත්මක භාවය හා ප්‍රමාණවත් බව මිණුම් ලකුණු කරයි. අංශ ප්‍රතිපත්ති සඳහා නිර්දේශ ඇතිකිරීමට, වැඩසටහන් උපායමාර්ග හා සේවා සැපයුම් කළමනාකරණයට, හා මෙම බාධක අමතා සේවා සැපයුම වැඩි දියුණු කිරීමට මෙම අන්තර්දෘෂ්ටි සහාය වේ. CRC මෙලෙස, පොදු සේවාවන්ගේ වැඩි දියුණුව සඳහා පුරවැසියන්ගේ විකල්ප විපරම් කර විවිධ මහජන සේවා මානයන් හරහා පුරවැසි තෘප්තිතාවයන් උදෙසා ක්‍රියාමාර්ග සලසයි.

මූලික සමීක්ෂණයක් වූයෙන්, අංශ අවධානය සීමා වූයේ අධ්‍යාපනය සහ ප්‍රජා ජංගනය වෙතය. CLAPP ව්‍යාපෘතියෙන් තෝරාගත් ග්‍රාම නිලධාරී (GN) කොට්ඨාශයන්ගේ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින් (CSOs) විසින් ප්‍රදේශය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා අවශ්‍යතා පදනම් කොට ගෙන අංශය තෝරා දෙනු ලැබීය. PAC සමඟ එක්ව CEPA විසින් CRC ක්‍රමවේදයන් පිළිබඳව පස්-දින ගෘහස්ථ පුහුණුවක්, වවුනියා සහ මුලතිවු දිස්ත්‍රික්ක GN තුළින් තෝරාගත් ලියාපදිංචි CSO නියෝජිතයින් සඳහා පවත්වන ලදී. CEPA සහ PAC මඟපෙන්වීම ඔස්සේ පුහුණු වැඩසටහනට සහභාගී වූවන් විසින් ප්‍රජාවන් සමඟ පැවැත්වූ සාකච්ඡා පදනම් කොටගෙන අධ්‍යාපන සේවාවන් පිළිබඳව මෙවලම් (ඇමුණුම 2) කෙටුම්පතක් සකසන ලදී. මෙවලම තුළින් CRC සම්බන්ධ සෑම අංගයක් පිළිබඳව ම අවධානය යොමු කරනු ලැබීය - පිවිසුම, ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය, ගැටළු හා අපහසුතා, සැඟවුණු/අමතර ගාස්තු, තෘප්තිතා මට්ටම් හා වවුනියා හා මුලතිවු දිස්ත්‍රික්කයන් තුළ අධ්‍යාපන සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා. CEPA විසින් මෙම කෙටුම්පත සේවා සපයන්නන් - කලාපීය අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත යොමු කර ඔවුන්ගේ ප්‍රතිචාර හා යෙදවුම් මෙවලමට ඇතුළත් කරන ලදී. වැඩි දියුණු කරන ලද මෙවලම භාවිතයෙන් CEPA විසින් දත්ත රැස්කරන්නන්/ප්‍රජාව කැඳවන්නන් පුහුණු කරනු ලැබ ඉන්පසු, වවුනියා හා මුලතිවු දිස්ත්‍රික්කයන් තුළ සම්පූර්ණ සමීක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව මූලික සමීක්ෂණයක් පවත්වනු ලැබීය.

ගෘහයන් අටසිය දෙකක් (802) සමීක්ෂණයට භාජනය විය - වවුනියාව තුළ 400 ක් හා මුලතිවු තුළ 402 ක්. වවුනියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී (GN) කොට්ඨාශයන් විස්සක්, දකුණු වවුනියාවෙන් දහසයක් (16), උතුරු වවුනියා අධ්‍යාපන කලාපයන්ගෙන් හතරක් (4), හා මුලතිවු අධ්‍යාපන කලාපයට අයත් මරිතමේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී (GN) කොට්ඨාශයන් විස්සක් සමීක්ෂණයට භාජනය වූහ. සමීක්ෂණය සඳහා තෝරාගත් ගෘහයන් සංඛ්‍යාව තීරණය කරනු ලැබුයේ අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාශයන් තුළ සිටි සිසුන් සංඛ්‍යාව පදනම් කොට ගෙනය. මේ සඳහා ගෘහයන් තෝරාගනු ලද්දේ අහඹු ආකාරයකටය. පළමුව ගෘහයේ වැඩිහිටියෙකු සමඟ සාකච්ඡාවක් සඳහා ගොස් දෙවනුව ගෘහයේ පාසැල් යන සිසුවෙකු සමඟ සාකච්ඡා කිරීම සඳහා එක් ගෘහයකට දෙවතාව බැගින් යනු ලැබීය. සමීක්ෂණයට භාජනය වූ ගෘහයන් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, සොයාගත් තොරතුරු අදාළ අධ්‍යාපන කලාපයන් හා අනුමාන කිරීමට හැකි වන නමුදු දිස්ත්‍රික්කයන් හා අනුමාන කිරීමක් කළ නොහැක. ඒ කෙසේ වෙතත්, ලේඛනයේ වචන යෙදුම අවම කිරීම උදෙසා මෙම වාර්තාව දිස්ත්‍රික්කයන් වෙත යොමුවකි. දත්තයන්ගේ සමූහස්ථ විශ්ලේෂණයට අමතරව, දත්තයන් විවිධ ජනවිකාසයන් (උදා: ලිංගභේදය) විසින් ද විශ්ලේෂණය කළ නමුදු ප්‍රතිඵල වාර්තා කරනු ලැබුයේ එහි සැලකිය යුත්තක් අඩංගු වූවා නම් පමණි.

# 2. ශිෂ්‍යයන් හා දෙමාපියන්ගේ ප්‍රතිචාර පිළිබඳ විශ්ලේෂණය

## 2.1. ලැබිය හැකි පාසල්, ප්‍රවේශ වීමේ හැකියාව හා භාවිතය

අධ්‍යාපනය සඳහා පිවිසීම මගින් ආසන්න ප්‍රදේශයන් තුළ තිබෙනා පාසැල් සහ එහි භාවිතය පිළිබඳ තක්සේරු කිරීමක් සිදු වේ. සමීක්ෂණයට භාජනය වූ ගෘහයන් 802 තුළ, ඉහළ ප්‍රතිශතයක් (98.7%) පාසැල් යන දරුවන් වූ වයස අවුරුදු 6 - 18 ත් අතර දරුවන් 1611 සිටියෝය. ඉන් වයස අවුරුදු 6 - 18 ත් අතර පාසැල් නොයන සිසුන් බහුතරයක් පිරිමි දරුවන් (77%) වූහ. නොහැකියාව (වගුව 2) පාසැල් නොයෑමට වූ ප්‍රධාන හේතුවක් වූ අතර, ඔවුන් සියලු දෙනාම වාගේ කෙදිනකවත් පාසැල් නොයාම තිබීම වඩාත් සැලකිල්ලට ගත යුතු කරුණකි. ඔවුන් අතරින් පාසැල් ගිය දරුවන්ගේ මග හැලීම සිදු වූයේ 8 වසරේ පටන්. අනෙක් අය මග හැලෙනුයේ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසුවය.

**වගුව 1: පාසැල් නොපැමිණීමට හේතු (වයස අවු. 6-18)**

| පාසැල් නොපැමිණීමට හේතු | වවුනියා | මුලතිවු | එකතුව |
|---|---|---|---|
| ආබාධිතකම් | 3 | 3 | **6** |
| පැමිණීමට අකමැති | 4 | 1 | **5** |
| දුර්වල ශාස්ත්‍රාලීය ප්‍රගතිය | | 5 | **5** |
| ආර්ථික ගැටළු | 2 | | **2** |
| රැකියා යෙදීම | | 1 | **1** |
| පාසැල දුරින් පිහිටීම | | 1 | **1** |
| වෙනත් | 1 | | **1** |
| **එකතුව** | **10** | **11** | **21** |

සාමාන්‍ය වශයෙන්, ආදර්ශයට ගත් ගෘහයන් තුළ එක් පවුලක 2.1 පාසැල් යන දරුවන් සිටිති. දෙමාපියන් සියයට හැත්තෑ එකක් (71%) පෙන්වා දෙන්නේ ඔවුන්ගේ පළාතේම පාසැලක් තිබෙනා වගයි. තමන්ගේම පළාතේ පාසැල් තිබෙනා මුලතිවූ අධ්‍යාපන කලාපයේ දෙමාපියන් සියයට හැත්තෑ හතරක් (74%), වාර්තා කරන්නේ ඔවුන්ගේ දරුවන් පළාතේ පිහිටි පාසැලට යන වගයි. නමුත්, වවුනියා අධ්‍යාපන කලාපයෙන් මෙලෙස වාර්තා දක්වන්නේ දෙමාපියන් සියයට පනහක් (50%) පමණි.

තම පළාත තුළම පිහිටි පාසැල්වල ඉගෙනුම ලබන දරුවන් සියයට හැට දෙකක් (62%) වාර්තා කරණුයේ ඔවුන් කිලෝමීටරයකටත් අඩු දුර ප්‍රමාණයක් ගමන් කරනා බවයි. නමුත්, පිට පළාත්වල පිහිටි පාසැල්වල ඉගෙනුම ලබන දරුවන් ඔවුන් කිලෝමීටරයකටත් අඩු දුර ප්‍රමාණයක් ගමන් කරනා බවට වාර්තා කරන්නේ සියයට දාහතක් (17%) පමණි. එහෙත්, වෙනත් පළාත්වල පාසැල් වලට යෑමට තීරණය කිරීම සඳහා දෙමාපියන් හා දරුවන් හට හේතූන් කිහිපයක් පවතී. මෙයට ප්‍රධානතම හේතුවක් වනුයේ, පිට පළාත්වල පිහිටි පාසැල්වලින් ඔවුන්ගේ දරුවන්ට ඊට වඩා හොඳ අධ්‍යාපනයක් ලැබෙනා (වගුව 3) බව ඊටත් ඉහළ ප්‍රතිශතයක දෙමාපියන් සංඛ්‍යාවක් විශ්වාස කිරීමය. අනෙක් හේතූන් අතරට පහත දක්වන කරුණු ද ඇතුළත් වේ

- පංති නොමැතිකම - විශේෂයෙන්ම උසස් පෙළ. ප්‍රතිචාර දක්වන්නන් 27% පෙන්වා දෙන්නේ ඔවුන්ගේ පළාතේ පිහිටි පාසැලේ 11 ශ්‍රේණියට ඉහළින් පංති නොමැති බවය.
- ඔවුන් (දෙමාපියන්) ඉගෙනුම ලද පාසැල්වලින්ම දරුවන් ඉගෙන ගන්නවාට වැඩි කැමැත්තක් දැක්වීම
- මිශ්‍ර නොවන පාසැල්වල ඉගෙනීමට වැඩි කැමැත්තක් දැක්වීම
- පළාතේ පිහිටි පාසැල්වල පහසුකම් නොමැතිකම - උදා: ගුරුවරුන්

එහෙයින්, ස්ථාන දෙකේම පාසැල් නොමැතිකම හෝ පිවිසුම පිළිබඳව ගැටළුවක් නොමැත. නමුත්, අධ්‍යාපන සේවා සැපයුම පිළිබඳව අසමතාවයක් දිස්ත්‍රික්කය තුළ පවතින බව දක්නට ලැබේ. පෞද්ගලික මනාපයන් පිළිබඳව අධ්‍යාපන බලධාරීන්ට සැලකිල්ලක් දැක්වීමට නොහැකිවීමට ඉඩ ඇති නමුත්, දිස්ත්‍රික්කයේ පාසැල් තුළ අධ්‍යාපන යෙදුම් ගුණත්වයන්ට අදාළ කරුණු සැලකිල්ලට ගත යුතු වන අතර එය සාකච්ඡාවට

භාජනය කළ යුතු වේ. දෙවැනි ගැටළුව අදාළ වනුයේ බහුතරයක්ම කෙදිනකවත් පාසැල් නොගියවුන් වූ හේතුවෙන්, අධ්‍යාපනය සඳහා පිවිසීමට නොහැකි වූ දරුවන් පිළිබඳවය.

**වගුව 2: අධ්‍යාපනයේ ප්‍රයෝජනය සමීප වශයෙන්**

| | අධ්‍යාපනය ප්‍රයෝජනවත් වූවා ද? | දරුවා පළාතේම ඉගෙනුම ලබයි | දරුවා පළාතෙන් පිට ඉගෙනුම ලබයි |
|---|---|---|---|
| **දෙමාපියන්** | ඉතා ප්‍රයෝජනවත් | 74% | 94% |
| | යම්තාක් ප්‍රයෝජනවත් | 26% | 6% |
| **සිසුන්** | ඉතා ප්‍රයෝජනවත් | 77% | 82% |
| | යම්තාක් ප්‍රයෝජනවත් | 23% | 18% |

## 2.2. අධ්‍යාපන පහසුකම් වල විශ්වාසනීයත්වය හා ගුණත්වය

### 2.2.1. යටිතල ව්‍යුහයන්ගේ පහසුකම්

දිස්ත්‍රික්කයන් දෙකේම වාර්තා වූ යටිතල ව්‍යුහ පහසුකම් ගුණත්වය යහපත් ව පවතින අතර, වවුනියාව තුළ ඉහළ මට්ටමක් පෙන්නුම් කරති. ඊට අදාළව මුලතිවු තුළ යටිතල ව්‍යුහ පිළිබඳව පහළ තෘප්ති මට්ටමක් පැවතීමට හේතු වශයෙන් දායක කළ හැක්කේ, සිසුන් වැඩි ප්‍රතිශතයක් මගින් ගොඩනැගිලි/පංතිකාමර පහසුකම් ප්‍රමාණවත් නොවන බව දැක්වීමයි (වගුව 4). ගොඩනැගිලි/පංතිකාමර නොමැති පාසැල් වල, ගස් යට හෝ වෙනත් පංති සමඟ මිශ්‍රව හෝ වෙන් නොකරන ලද කාමරයන් තුළ විෂයයන් වෙන් කොට පංති පවත්වන බව ද ඔවුන් වාර්තා කරයි.

පහසුකම් සපයන අනෙක් ස්ථානයන් මෙන්, මුලතිවු හි සිසුන් වවුනියාවේ සිසුන් හා සැසඳීමේ දී පුස්තකාල, විද්‍යාගාර හා පරිගණකාගාර පහසුකම් භාවිතය සඳහා වැඩි වශයෙන් සීමාවන්ට ලක්වීමක් ඇති බවට පෙන්නුම් කරයි (වගුව 5). විද්‍යාගාරයන්ගේ අඩු භාවිතය සඳහා වැඩි වශයෙන් දායක වන්නේ විද්‍යාගාර උපකරණ නොමැති වීම හා/හෝ පරීක්ෂණාගාර සහායකයන් නොමැති වීමය. යම් ස්ථානයක පහසුකම් නොමැති වූ විට, සිසුන්ව කිට්ටුවෙන්ම ඇති පාසැල් පරීක්ෂණාගාරය වෙත ගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, මුලතිවු හා වවුනියා දිස්ත්‍රික්කයන් තුළ සියයට දහඅටක් (18%) හා සියයට දෙකක් (2%) අනුපිළිවෙළින් ප්‍රතිචාර දක්වන සිසුන් පෙන්වා දෙන්නේ පරීක්ෂණාගාර පහසුකම් නොමැති හෙයින් ඔවුන් ප්‍රායෝගික විද්‍යාව නොකරන බවයි. පරිගණකාගාර භාවිතයට අදාළ ගැටළු මතුවන්නේ ප්‍රමාණවත් පරිගණකයන් නොමැතිකම, ගුරුමණ්ඩලයක් නොමැතිකම හා විදුලි සම්බන්ධතාවක් නොමැතිකම හේතුවෙනි (මුලතිවු තුළ 9%).

වවුනියාවේ පාසැල් සිසුන් ජල හා වැසිකිළි පහසුකම් පිළිබඳව ඉහළ තෘප්ති මට්ටම් වාර්තා කරන අතර, මුලතිවු හි සිසුන් මේ පහසුකම් දෙක පිළිබඳව මඳ වශයෙන් පහළ තෘප්තිතා මට්ටමක් වාර්තා කරති. මෙම පළාත් දෙකේම සිසුන් ඔවුන්ගේ පාසැල් තුළ ජලයේ ගුණත්වය පිළිබඳව සංවේගයක් දැක්වීම සැලකිය යුතු කරුණකි (වගුව 6).

ක්‍රීඩාව ස්වරූපයෙන් සිදු කරන විනෝද ක්‍රියා සිසු ජීවිතය තුළ වැදගත් අංගයක් නිර්මාණය කරති. වවුනියාව තුළ (වගුව 7) ක්‍රීඩා කිරීම සඳහා පිට්ටනි පහසුකම් ඉතාමත් අඩු මට්ටමක පවතින අතර, සිසුවන් පෙන්නුම් කර දක්වන්නේ ඔවුන් ක්‍රීඩා උත්සව සඳහා ළඟම ඇති පාසැලේ ක්‍රීඩාපිටිය හෝ පළාතේ පිහිටි පොදු ක්‍රීඩාපිටිය භාවිතා කරන බවයි. වවුනියාවේ සියයට හතට (7%) ආසන්න සිසුන් සංඛ්‍යාවක් පෙන්වා දෙන්නේ ක්‍රීඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් ක්‍රීඩා උත්සව කිසිසේත් නොපවත්වන බවයි.

දිස්ත්‍රික්ක දෙකේම සිසුන් පාසැලේ වෛද්‍ය පහසුකම් පවතින බව දක්වන නමුදු ඉන් වැඩි ප්‍රතිශතයක් (75%) දක්වන්නේ එය ප්‍රථමාධාර පෙට්ටියකට පමණක් සීමා වූ බවයි. වවුනියාවේ සිසුන් කුඩා ප්‍රතිශතයක් විසින් දක්වන්නේ ඔවුන්ට වෛද්‍ය පහසුකම් කොටසක් වශයෙන් විවේකය සඳහා ඉඩ ප්‍රමාණයක් හා ප්‍රවාහන පහසුකම් ඇති බවයි. වවුනියාවේ වෛද්‍ය පරීක්ෂණ ක්‍රියාවලිය මුලතිවු වලට වඩා ස්ථාවරව පවතී. මෙම වෛද්‍ය පරීක්ෂණ රුධිර, අක්ෂි, දන්ත, ශරීර ස්කන්ධ, කන්, ශ්වසන පද්ධතිය, උගුර, පපුව හා එන්නත් සඳහා අදාළය. ඒ කෙසේ වෙතත්, දිස්ත්‍රික්කයන් දෙකෙන්ම වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය වූ සිසුන් දක්වන්නේ පරීක්ෂණයෙන්

පසු ඔවුන්ට වෛද්‍ය වාර්තා ලබා දීම අඩු ප්‍රතිශතයක පවතින බවයි (වගුව 8).

**වගුව 3: ගොඩනැගිල්ලේ / පංති කාමරයේ පහසුකම් ප්‍රමාණවත්කම (හෝ අඩුව) ශිෂ්‍යයන් වාර්තා කිරීම**

| අධ්‍යාපන කොට්ඨාශය | ගොඩනැගිල්ලේ ගුණාත්මකභාවය | පංතිකාමර පහසුකම් | ගෘහ භාණ්ඩ | පංතිකාමරයේ ඉඩකඩ හා ආලෝකය | මායිම් සුරක්ෂිතභාවය |
|---|---|---|---|---|---|
| වවුනියා | 97% | 97% | 97% | 97% | 98% |
| මුලතිවු | 78% | 81 % | 82% | 89% | 91% |

**වගුව 4: පුස්තකාල සහ පරීක්ෂණාගාර පහසුකම්**

| අධ්‍යාපන කොට්ඨාශය | පුස්තකාලය | | විද්‍යාගාරය | | | පරිඝණකාගාරය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පාසැලේ පුස්තකාලය | පුස්තකාල ග්‍රන්ථ සෑහේ ද යන වග | විද්‍යාගාරයක් තිබේ ද යන වග | පවතින තැන්වල විද්‍යාගාරය සිසුන්ට විවෘතද නැතිද යන වග | පරීක්ෂණාගාර පහසුකම් සිසුන්ට සෑහේ ද යන වග | පරිඝණකාගාරයක් තිබේ ද යන වග | පරිඝණකාගාරය විවෘතද නැතිද යන වග | පරීක්ෂණාගාර පහසුකම් සිසුන්ට සෑහේද යන වග |
| වවුනියා | 100% | 95% | 98% | 99% | 93% | 99% | 95% | 91% |
| මුලතිවු | 93% | 93% | 80% | 92% | 83% | 85% | 84% | 76% |

**වගුව 5: ප්‍රමාණවත් ජල හා වැසිකිළි පහසුකම්**

| අධ්‍යාපන කොට්ඨාශය | පානීය ජලය | | | වැසිකිළි | | | |
|---|---|---|---|---|---|---|---|
| | පානීය ජල පහසුකම් | ළිඳේ ආරක්ෂාව | පානීය ජලයේ ගුණත්වය | වැසිකිළි සෑහේ ද? | වෙනම ස්ත්‍රී/පුරුෂ වැසිකිළි | වැසිකිළි සඳහා ජලය | ස්ථිර වැසිකිළි |
| වවුනියා | 97% | 95% | 90% | 97% | 98% | 95% | 99% |
| මුලතිවු | 84% | 75% | 64% | 91% | 99% | 88% | 92% |

**වගුව 6: ක්‍රීඩා පහසුකම්**

| | ක්‍රීඩාපිටි පහසුකම් | ක්‍රීඩා උපකරණ පහසුකම් |
|---|---|---|
| වවුනියා | 75% | 97% |
| මුලතිවු | 95% | 93% |

**වගුව 7: වෛද්‍ය පහසුකම්**

| අධ්‍යාපන කොට්ඨාශය | පාසැලේ වෛද්‍ය පහසුකම් | දරුවා වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පෙනී සිටියා ද | ඔවුන් වෛද්‍ය වාර්තා පතක් සැපයුවා ද |
|---|---|---|---|
| වවුනියා | 98% | 88% | 38% |
| මුලතිවු | 91% | 37% | 34% |

### 2.2.2. ගුරුමණ්ඩලය

පාසැලක් විසින් දෙනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මක භාවය රඳා පවතින්නේ, සිසුන්ට තම මනාපයන් හා කුසලතාවන් අනුව විෂයන් තෝරාගැනීමේ පහසුකම සැපයීමේ හැකියාව මතය. සියළුම විෂයන් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සිටී ද හා ඔවුන් උගන්වන එම විෂයන් (රූපය 1) සඳහා විශේෂඥයන් ද, පිළිබඳ ප්‍රශ්නයට මුලතිවූ සිසුන් වඩාත් අඩු අය ගණනක් දක්වයි. දිස්ත්‍රික්කයන් දෙකේම සිසුවන් දක්වන්නේ, ගුරුවරුන් සඳහා අඩුපාඩු ඇති විෂයන් තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි හා විද්‍යාව වන බවයි. ගුරුවරුන් නොමැති වූ විට පාසැලේ එම විෂයන් උගන්වන්නේ නැත. එවිට, දරුවාට තම හැකියාව හෝ මනාපය අනුව විෂයන් තෝරා ගැනීමේ දී මෙයින් බලපෑමක් ඇති වේ.

සාමාන්‍යයෙන්, ගුරුවරුන් හා පවත්නා සබැඳියාව පිළිබඳව සිසුන් සතුටුදායක තත්වයක් දක්වති. සිසුන් සියයට අනූපහක් (95%) විසින් දක්වන්නේ තම දෙමාපියන් සමඟ ගුරුවරුන් වාරයකට වරක්වත් රැස්වීම් පවත්වන බවය. දෙමාපියන් ද පාසැල් සංවර්ධන රැස්වීම් සඳහා සහභාගිත්වය දක්වා කාර්ය මණ්ඩලය හා ගුරුවරුන් සමඟ අන්තර් ක්‍රියා වර්ධනයක් ඇති කරති. එනමුදු, දෙමාපියන් පාසැල් කළමනාකාරිත්වය හා මද වශයෙන් අඩු සබැඳියාවක් වාර්තා කරති (රූපය 2). දෙමාපියන් තම දරුවන්ගේ ප්‍රගතියට අදාළව ගුරුවරුන් හා නිරතුරුව සබැඳියාවන් පවත්වන නමුදු, ඔවුන් කළමනාකාරිත්වය සමඟ කතාබහ කිරීමට වැඩි උනන්දුවක් දක්වන්නේ නැත.

**රූපය 1: ගුරුමණ්ඩලය**



**රූපය 2: ශිෂ්‍යයන් / දෙමාපියන් හා පාසැල් කාර්ය මණ්ඩලය අතර සබැඳියාව**




### 2.2.3. ශිෂ්‍ය සුභසාධක සේවා

ශ්‍රී ලාංකීය රජය විසින් ඉතා සුළු වියදමකට අධ්‍යාපනය සැපයීමට අමතරව, පවුල්වල අධ්‍යාපන වියදම් අඩු කිරීම උදෙසා දිවා-ආහාර, පාඩම් පොත් හා නිල ඇඳුම් යනාදී වෙනත් ආධාරයන් කිහිපයක් ද සපයනු ලැබේ. විශේෂයෙන්ම දුප්පත් ප්‍රජාවන්ට දිළිඳු කමින් මිදීම සඳහා වැදගත්ම මඟක් වශයෙන් දක්වන අධ්‍යාපනය වෙත පිවිසීමේ හැකියාව තහවුරු කොට එය ලබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා, රජය විසින් මෙම පියවරයන් ආදේශ කරනු ලැබූහ.

වවුනියා දිස්ත්‍රික්කයෙන් සමීක්ෂණයට භාජනය වූ සිසුන්ගෙන් ප්‍රමාණවත් ප්‍රතිශතයක් (47%) දක්වන්නේ ඔවුන්ගේ පාසැල් තුළ දිවා-ආහාර සපයන ක්‍රමවේදයක් නොමැති බවයි. තවද, දිවා-ආහාරය පිළියෙළ කරනා ආකාරය හා එහි සෞඛ්‍යමය තත්ත්වය පිළිබඳව දෙමාපියන් තුළ වූ අසතුට, පාසැලෙන් සපයන දිවා-ආහාරය සඳහා සමහර සිසුන් සහභාගී නොවීමට හේතුදායක විය.

**වගුව 8: කෑම**

| | | දිවා ආහාරය ලැබීම පිළිබඳව | | | කැන්ටීම | |
|---|---|---|---|---|---|---|
| **අධ්‍යාපන කොට්ඨාශය** | **දිවා ආහාරය ලැබීම පිළිබඳ** | **නිසි වේලාවට ලැබීම පිළිබඳ** | **පෝෂණීය ආහාර** | **නිසියාකාරව සැකසීම පිළිබඳ** | **කැන්ටීමක් තිබේද යන වග** | **ආහාර ගුණාත්මක භාවය - ගුණ අනුපාතය** |
| වවුනියා | 38% | 99% | 81% | 90% | 94% | 92% |
| මුලතිවු | 76% | 98% | 92% | 91% | 90% | 89% |

පාඩම් පොත් හා නිල ඇඳුම් සඳහා රෙදි ලැබෙනා බවට දිස්ත්‍රික්කයන් දෙකේම සිසුන් වැඩි ප්‍රතිශතයකින් දක්වයි. මුලතිවු හි සිසුන් නියමිත වේලාවට පොත් ලැබෙනා බවට දක්වන්නේ ඊට සාපේක්ෂව

අඩු ප්‍රතිශතයකිනි. එහෙයින්, ඔවුන් අනෙක් සිසුන්ගෙන් තාවකාලිකව පොත් ඉල්ලා ගැනීම, පාඩම් පොත්වල ඡායාපිටපත් ගැනීම හා පංති සටහන් තුළින් පාඩම් කිරීම වැනි පියවරයන් ගැනීම සඳහා පෙළඹේ. වවුනියාවේ සිසුන් කියා සිටින්නේ නිල ඇඳුම් සඳහා සපයන ලද රෙදි ප්‍රමිතියෙන් තරමක් බාල වූ බවය (වගුව 9).

**වගුව 9: රජයෙන් සපයන ප්‍රතිපාදන**

| අධ්‍යාපන කොට්ඨාශය | පාඩම් පොත් | නිල ඇඳුම් | |
|---|---|---|---|
| | දරුවාට පාඩම් පොත් නිසි වේලාවට ලැබීම පිළිබඳ | දරුවාට නිල ඇඳුම් සඳහා රෙදි ලැබීම පිළිබඳ | රෙදිවල ගුණාත්මක භාවය පිළිබඳ |
| වවුනියා | 94.3% | 99.80% | 80% |
| මුලතිවු | 90.5% | 99.30% | 95% |

## 2.3. අධ්‍යාපන සේවාවන් වෙත පිවිසීමට පවතින ගැටළු හෝ අපහසුතා

සිසුන් 23% ක් දක්වන්නේ ඔවුන්ට අධ්‍යාපන සේවාවන් වෙත පිවිසීම සඳහා ගැටළු හා අපහසුතා ඇති වූ බවයි. ප්‍රධානතම හේතුන් වශයෙන් දැක්වූයේ අධ්‍යාපන සේවාවන් සැපයුම හා ගුරුවරුන් නොමැති බවයි (වගුව 11). දෙවන හේතුව වශයෙන් දක්වනුයේ ගොඩනැගිලි පහසුකම්, ජල පහසුකම්, වැසිකිළි පහසුකම් හා වැදගත්ම වශයෙන් ක්‍රීඩා පිට්ටනි පහසුකම් පිළිබඳවය. සිසුවියන් බහුතරයකගේ ගැටළුව ගුරුවරුන් හා ඉගැන්වුම් ක්‍රමවේදය වූ අතර, සිසුවන් වැඩි වශයෙන්ම වාර්තා කරනුයේ පාසැල තුළ පහසුකම් නොමැතිකම පිළිබඳවය. සම්මුඛ පරීක්ෂණයට භාජනය වූ සිසුන්ගේ දෙමාපියන් විසින් ද ගැටළු හා අපහසුතා පිළිබඳව දක්වනුයේ මීට සමාන මට්ටමකි (ප්‍රතිශතයක් වශයෙන්). ඉහළ අධ්‍යාපනය (සරසවි අධ්‍යාපනය) ලබා ඇති පිය පාර්ශවය, අඩු අධ්‍යාපනයක් (සා./පෙළට පහළ අධ්‍යාපනයක්) ලබා ඇති මව් පාර්ශවයට වඩා ගැටළු ඉස්මතු කිරීමේ ප්‍රවණතාවක් දැක්වීම සැලකිල්ලට ගත යුත්තකි. කිසි කලක අධ්‍යාපනයක් නොලද දෙමාපියන් ගැටළු ඉස්මතු කිරීමක් සිදු නොකරයි. මෙලෙසින්, අධ්‍යාපන සේවාවන් වර්ධනය කර වැඩි දියුණු කිරීම උදෙසා, දෙමාපියන් හා සිසුන් සමඟ සබැඳියාවක් පැවැත්වීමේ අවශ්‍යතාව ඉතාමත් වැදගත් තැනක් ගනී.

**වගුව 10: ගැටළු හෝ අපහසුතා**

| අධ්‍යාපන සේවාවන් වෙත ළඟාවීමට ඇති අපහසුතාවයනට හේතු | වවුනියා | | මුලතිවු | |
|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු |
| ගුරුවරයා පංතිකාමරයේ නොසිටීම | 4% | 6% | 7% | 9% |
| ගුරුවරයාගේ ඉගැන්වුම් ක්‍රමවේදය | 4% | 3% | 5% | 9% |
| ගුරුවරුන් මදිපාඩුව | 4% | 4% | 3% | 5% |
| පහසුකම් | 4% | 1% | 14% | 7% |

සමීක්ෂණයට භාජනය වූ සිසුන් 10% ක් වෙනස්කම් වලට ගොදුරු වූ බව දක්වයි. මුලතිවු තුළ දෙමාපියන්ට වඩා සිසුන් ඉහළ ප්‍රතිශතයක් විසින් වෙනස්කම් වලට ගොදුරු වූ බව වාර්තා කිරීම තුළින් දක්වන්නේ ඔවුන් ඒ සම්බන්ධව දෙමාපියන්ට වාර්තා කිරීමක් සිදු නොකරන බවයි. සිසුන්ගේ අධ්‍යාපන මට්ටම් හා ආර්ථික තත්ත්වයන් මේ වෙනස්කම් සඳහා ගොදුරු වීමට හේතුදායක වූ අතර, ගුරුවරුන් මෙම වෙනස්කම් සිදු කරන පාර්ශවය වශයෙන් වාර්තා වේ (12). වෙනස්කම් වලට ගොදුරු වන්නන් දක්වන්නේ, පාර්ශවයන් කිහිපයක් විසින්ම එසේ සිදුවන බව හා සමහර අවස්ථා වලදී සිසුන්, ගුරුවරුන් හා කළමනාකාරිත්වය යන තුන් පාර්ශවය විසින්ම මෙසේ සිදුවන බවයි.

**වගුව 11: වෙනස්කම් සිදුකිරීම**

| වෙනස්කම් සිදුකිරීම | වවුනියා | මුලතිවු |
|---|---|---|
| **වාර්තා කරන** | | |
| ෂිසුන් | 7.3% | 14% |
| ඳෙමාපියන් | 8.0% | 10% |
| **වෙනස්කම් සිදුකරන්නේ කවුරුන් ද - වෙනස්කම් පිළිබඳව වාර්තා කරන සිසුන්ගේ ප්‍රතිශතය (කිහිප දෙනෙකු දැක්විය හැක)** | | |
| ගුරුවරුන් | 48.5% | 58.8% |
| ෂිසුන් | 48.5% | 33.8% |
| කළමනාකාරිත්වය | 3% | 7.4% |
| **වෙනස්කම් සිදුකිරීමට පදනම් වූ හේතු - වෙනස්කම් පිළිබඳව වාර්තා කරන සිසුන්ගේ ප්‍රතිශතය (හේතු කිහිපයක් දැක්විය හැක)** | | |
| අධ්‍යාපන මට්ටමින් | 53.8% | 49.4% |
| ආර්ථික මට්ටමින් | 28.2% | 25.3% |
| සමාජ පසුබිමින් | 10.3% | 8.4% |
| පාසැල් කළමනාකාරිත්වය සමඟ දෙමාපියන්ගේ සබැඳියාව | 0.0% | 9.6% |
| දෙමාපියන් ගුරුවරුන්ට විරුද්ධව පැමිණිලි කිරීම/බාධා කිරීම නිසා වෙනස්කම් | 2.6% | 4.8% |

සිසුවන් විසින් සිසුවියන්ට සාපේක්ෂව දඬුවම් පමුණුවීම් පිළිබඳව වාර්තා කිරීමේ ඉහළ මට්ටමක් පවතී. මේ පිළිබඳව පැමිණිලි කරන දෙමාපියන් සංඛ්‍යාව ඉතාමත් අඩු වූ හෙයින් පෙනී යන්නේ ඔවුන් ඒ සම්බන්ධව දෙමාපියන්ට වාර්තා කිරීමක් සිදු නොකරන බවයි (වගුව 13). මෙහි ප්‍රධානතම වරදකරු වන්නේ පංතිභාර ගුරුවරයාය. ඊට අමතරව, අංශ ප්‍රධානියා, විදුහල්පති හා ශිෂ්‍ය නායකයන් විසින් ද සිසුන් හට දඬුවම් පමුණුවනු ලැබේ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අංක ED/01/12/01/04/24 දරන ආඥාපත්‍රය අනුව ප්‍රකාශ දක්වන්නේ ශාරීරික දඬුවම් පමුණුවීම පාසැල් තුළ සිදු නොකළ යුතු බවයි. නමුත්, පාසැල් තුළ විනය පැවැත්වීමේ ප්‍රධාන ක්‍රමවේදයක් වශයෙන් ශාරීරික දඬුවම් පමුණුවීම සිදු කෙරේ. වාචික අපයෙදුම හා නුසුදුසු වචන භාවිතය පිළිබඳව ද සිසුන් වාර්තා කරති. උතුරු අධ්‍යාපන නිරීක්ෂණ වාර්තාවේ ඉතා වැදගත්ම යෝජනා දහය අතරින්, ශාරීරික දඬුවම් පමුණුවීම තහනමට ලක් කිරීමේ යෝජනාව පළමු තැන ගන්නා බව සැලකිල්ලට ගත යුතු කරුණකි.

අවස්ථා පැදීම සම්බන්ධව, සිසුන්ට හැඟෙන්නේ නායකත්වය හා උත්සව සඳහා සහභාගී වීමට ඔවුන්ට සෑහීමකට පත්විය හැකි අවස්ථා පැදෙන බවයි (වගුව 14). කෙසේ වෙතත්, වවුනියාවේ සිසුන්ගේ දෙමාපියන් මේ පිළිබඳව සම මතයන් නොදරයි. ඔවුන්ගේ ප්‍රධානතම පැමිණිල්ල වන්නේ, තෝරාගැනීම් වලදී ගුරුවරුන් පක්ෂපාතීව ක්‍රියා කරන බවයි.

**වගුව 12: දඬුවම්**

| දඬුවම් | වවුනියා | මුලතිවු |
|---|---|---|
| **වාර්තා කරන** | | |
| සිසුවන් - පිරිමි ළමයි | 47% | 57% |
| සිසුවියන් - ගැහැනු ළමයි | 35% | 39% |
| | | 34% |
| **දඬුවම් කරන්නේ කවුරුන් ද - දඬුවම් පිළිබඳව වාර්තා කරන සිසුන්ගේ ප්‍රතිශතය (කිහිප දෙනෙකු දැක්විය හැක)** | | |
| පංතිභාර ගුරුවරයා | 84% | 91% |
| අංශ ප්‍රධානී | 7% | 13% |
| විදුහල්පති | 8% | 10% |
| **දඬුවම් ක්‍රමය - දඬුවම් පිළිබඳව වාර්තා කරන සිසුන්ගේ ප්‍රතිශතය (බහු ආකාරයන් දැක්විය හැක)** | | |
| වේවැල් පහර දීම | 74% | 53% |
| දණ ගැස්සීම | 4% | 19% |
| පංතියෙන් පිටතට යැවීම | 19% | 29% |
| වෙනත් | 5% | 4% |
| **අපයෙදුම්** | | |
| සමීක්ෂණයට භාජනය වූ සියළුම සිසුන් අපයෙදුම් පිළිබඳව වාර්තා කිරීමේ ප්‍රතිශතය | 5% | 11% |

**වගුව 13: අවස්ථා**

| | වවුනියා | මුලතිවු |
|---|---|---|
| **සිසුන් විසින් වාර්තා කරන ලද** | | |
| නායකත්වය සඳහා සිසුන් හට සම වශයෙන් අවස්ථා පැදේ | **91%** | **93%** |
| උත්සවයන්ට සහභාගීවීම සඳහා සිසුන් හට සම වශයෙන් අවස්ථා පැදේ | **94%** | **94%** |
| **දෙමාපියන් විසින් වාර්තා කරන ලද** | | |
| නායකත්වය සඳහා සිසුන් හට සම වශයෙන් අවස්ථා පැදේ | 83% | 92% |
| උත්සවයන්ට සහභාගීවීම සඳහා සිසුන් හට සම වශයෙන් අවස්ථා පැදේ | 91% | 93% |

සමීක්ෂණයට භාජනය වූ සිසුන් අඩකට සමීප සංඛ්‍යාවක් දක්වන්නේ ඔවුන්ට පාසැලේ පැමිණිලි/ගැටලු පවතින බවයි. වාර්තා කරන ලද/සාකච්ඡාවට ලක් වූ, බහුතරයක් ගැටලු සැහීමකට පත්විය හැකි අයුරින් විසඳනු ලැබූ අතර, අදාළ බලධාරීන් සමඟ සිසුන් ගැටළු සාකච්ඡා කිරීමේ ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පවතී (රූපය 3 සහ රූපය 4). සාමාන්‍යයෙන් ගුරුවරයා විසින් නියෝජනය කරන්නේ ගැටලු කුඩා ප්‍රතිශතයකි. ඔවුන්ගේ දෙමාපියන්ගේ අවවාද පරිදි එය අතහැර දැමීම, ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග නොදැන සිටීම හා පැමිණිලි කිරීමේ ඵලවිපාක පිළිබඳව දෙගිඩියාව සිසුන් තම පැමිණිලි ඉදිරිපත් නොකරන හේතූන් අතර වේ.

**රූපය 3: ගැටලු නිරාකරණය**




**රූපය 4: ගැටලු වාර්තා කරනුයේ**




## 2.4. සැඟවුණු ගාස්තු/අමතර වියදම්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013/11 නිකුත් කළ ආඥාපත මගින් ඉල්ලා සිටිනුයේ මූලික ගාස්තුවන්ට අමතරව සිසුන්ගෙන් වෙනත් ගාස්තු අය නොකළ යුතු බවය. සමීක්ෂණයට භාජනය වූ සිසුන් හා දෙමාපියන් දක්වන්නේ පහසුකම්/වාර්ෂික ගාස්තුවන්ට අමතරව පාසැල් මගින් නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා මුදල් අය කරනා බවයි (වගුව 15). නම් වශයෙන්, උත්සව සඳහා මුදල් එකතු කිරීම (ත්‍යාග ප්‍රදානයන්/ක්‍රීඩා දිනය යනාදිය), ආරක්ෂක නිලධාරීන් පත් කිරීම, පාසැලේ තීන්ත ගෑම හා විදුලිය සැපයීම මීට අයත් වේ.

දෙවනුව, ලබාගත් එවැනි මුදල් සඳහා ගිණුම්කරණය සහ ඒ පිළිබඳව දක්වන වගකීම හා විනිවිද භාවයයි. මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කිරීමේ පුරුද්ද ඉතාමත් අඩුව පවතී. විශේෂයෙන්ම මුලතිවූ අධ්‍යාපන කලාපයේ එය ඉතාමත් අඩු මට්ටමකින් පවතී. එනිසා, දිස්ත්‍රික්ක දෙකේම වාර්ෂික මහාසභා රැස්වීම් වලදී

ගිණුම් ඉදිරිපත් කරනා විට කුවිතාන්සි නිකුත් කිරීමේ යහපත් ක්‍රියාපිළිවෙළක් අනුගමනය කිරීම වඩාත් සුදුසු වේ (වගුව 16). මේ හේතුවෙන් වවුනියා හා මුලතිවු වල අනුපිළිවෙළින් 10% ක් හා 12% ක් දෙමාපියන්ට අසතුටක් හා ග්‍රහණය කිරීමට අපහසු බවක් ඇතිවිය හැක. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013/11 නිකුත් කළ ආඥාපතෙහි නියත වශයෙන්ම සඳහන් කෙරෙනුයේ, යම් සිසුවෙකුට ගාස්තු ගෙවීමට නොහැකි වූ අවස්ථාවක දී, ඔහු හෝ ඇය විසින් ඊට අදාළ බලධාරීන් සපයන ලද ඒ සඳහා සහාය දක්වන ලියවිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසු, පාසැල් බලධාරීන් විසින් එම ගාස්තුව අතහැර දැමිය යුතු බවය.

**වගුව 14: ගාස්තු/පාසැලට ගෙවීම්**

| ගාස්තු/ගෙවීම් | විවිධ ගෙවීම් දක්වන ප්‍රතිශතයන් | | ගෙවීම් සිදු කරන්නන් හට කුවිතාන්සි ලැබෙනා බවට දක්වන ප්‍රතිශතයන් | |
|---|---|---|---|---|
| | වවුනියා | මුලතිවු | වවුනියා | මුලතිවු |
| පහසුකම් ගාස්තු | 98% | 72% | 52.0% | 14.0% |
| පාසැල් සංවර්ධනය | 81% | 32% | 30.0% | 4.0% |
| වාර්ෂික ගාස්තු | 66% | 59% | 25.0% | 6.0% |
| උත්සව සඳහා මුදල් | 65% | 78% | 1.3% | 1.7% |
| පරිත්‍යාග | 6% | 9% | 1.0% | 0.7% |
| වෙනත් | 13% | 20% | 1.3% | 0.5% |

**වගුව 15: වාර්ෂික මහා සභා රැස්වීම්**

| වාර්ෂික මහා සභා රැස්වීම්වල දී ගිණුම් ඉදිරිපත් කිරීමේ පිළිවෙත් | වවුනියා | මුලතිවු |
|---|---|---|
| වාර්ෂික මහා සභා රැස්වීම්වල දී ඔබට වාර්ෂික ගිණුම් ලබා දුන්නෙහි ද? | 95% | 98% |
| රැස්වීම් අතරතුර දී ඔබට ගිණුම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වූවා ද? | 98% | 98% |
| ඔබට අවශ්‍ය පරිදි තොරතුරු ලැබුනා ද? | 98% | 97% |

## 2.5. තෘප්තිතා මට්ටම්

යටිතල ව්‍යුහයන්ගේ පහසුකම් ගුණාත්මක භාවයට අදාළව, වවුනියාවේ පාසැල් සිසුන් විසින් ඉතා ඉහළ වූ තෘප්ති මට්ටමක් දක්වනු ලබනා අතර, මුලතිවු හි පාසැල් සිසුන් විසින් යටිතල ව්‍යුහයන්ගේ පහසුකම් පිළබඳව දක්වන්නේ අඩු මට්ටමක තෘප්තිතාවයකි. මුලතිවු හි පාසැල්වල ජලයේ දක්වන අඩු ගුණාත්මක භාවය (වගුව 6), ජල පහසුකම් පිළිබඳ අඩු තෘප්ති මට්ටමක් දැක්වීම (රූපය 5) සඳහා හේතුදායක වේ.

**රූපය 5: පහසුකම් සමග තෘප්ති මට්ටම - ශිෂ්‍යයන් වාර්තා කරන සම්පූර්ණ තෘප්තිතාවය**




සාමාන්‍ය වශයෙන්, ගුරුමණ්ඩල සංඛ්‍යාව, ඔවුන්ගේ පැමිණීම්, ගුරුවරුන් විසින් සපයන අධ්‍යාපනය, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හා පවතින විෂයන් පිළිබඳව සිසුන් ඉහළ තෘප්ති මට්ටම් දක්වති. කෙසේ වෙතත් මුලතිවු හි සිසුන්, විශේෂයෙන්ම සිසුවියන්, ගුරුවරුන්ගේ සංඛ්‍යාව හා සපයන අධ්‍යාපනය පිළිබඳව ඊට සාපේක්ෂව අඩු තෘප්ති මට්ටමක් දක්වති. එහෙයින්, මුලතිවු හි සිසුන් හට, විශේෂයෙන්ම සිසුවියන් හට, අධ්‍යාපනය අත්කර ගැනුමට බාධාවක් ඇති නොවීම (රූපය 6) තහවුරු කිරීම සඳහා පුළුල් වැටහුමක් අවශ්‍ය වේ.

**රූපය 6: ඉගැන්වුම සමග තෘප්ති මට්ටම - ශිෂ්‍යයන් වාර්තා කරන සම්පූර්ණ තෘප්තිතාවය**




දෙමාපියන් හා සිසුන්ට පාසැලේ ගුරුවරුන් හා කළමනාකාරිත්වය අතර අන්තර් ක්‍රියා සඳහා අවස්ථා පැදීම තුළින් අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම හා අධ්‍යාපනය අත්කර ගැනුමට වැදගත් මාවතක් සැකසේ.

වවුනියාව තුළ, දෙමාපියන් හා සිසුන් පාසැල් වල ගුරුවරුන් හා කළමනාකාරිත්වය සමඟ අන්තර් ක්‍රියා සඳහා ඉහළ මට්ටමක උනන්දුවක් දැක්වූ හෙයින් එය ගැටලු නිරාකරණය සඳහා මහත්සේ දායක විය (රූපය 7). මුලතිවු හි දෙමාපියන් පාසැල් කළමනාකාරිත්වය හා ඉහළ මට්ටමකින් අන්තර් ක්‍රියා වාර්තා කරන අතර, සිසුන් ඊට සාපේක්ෂකව අන්තර් ක්‍රියා හා ගැටලු නිරාකරණය පිළිබඳව දක්වන්නේ පහළ මට්ටමකි.

**රූපය 7: ගුරුවරුන් සමග අන්තර් ක්‍රියා - ශිෂ්‍යයන් හා දෙමාපියන් වාර්තා කරන සම්පූර්ණ තෘප්තිතාවය**




සමස්තයක් වශයෙන් වවුනියාවේ තෘප්තිතාවය ඉහළ මට්ටමක පවතී (රූපය 8). නමුත් අවශ්‍ය පරිශ්‍රමය හා කාලයාත් සමඟ මුලතිවු හි පාසැල් තුළ සිසුන් හා දෙමාපියන් අතර ඉහළ තෘප්තිතා මට්ටමක් අත්කර ගැනුමට හැකිවනු ඇත. වවුනියාවේ සිසුවියන් හා දෙමාපියන්, ප්‍රතිචාර දක්වන පිරිමින්ට වඩා සමස්තයක් වශයෙන් අඩු තෘප්ති මට්ටමක් වාර්තා කිරීම සැලකිල්ලට ගත යුතු කරුණක් වන අතර, මෙය වැඩිදුර විමර්ශනයට ලක් කළ යුතු වේ.

රූපය 8: සමස්ත තෘප්තිතාවය




## 2.6. වැඩි දියුණුව සඳහා යෝජනා

සිසුන් හා දෙමාපියන් ඔවුන්ගේ අදාළ දිස්ත්‍රික්කයන් තුළ අධ්‍යාපන සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනු ලැබුහ. දිස්ත්‍රික්කයන් දෙකෙන් ඉදිරිපත් කළ මෙම යෝජනා බහුතරයක්ම සමව පවතින අතර එය පහසුකම්/සේවාවන්, ඉගැන්වීම් හා මූල්‍ය යනුවෙන් වර්ගීකරණ තුනකින් ලැයිස්තු දක්වනු ලැබීය (වගුව 17).

**වගුව 16: අධ්‍යාපන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යයන්ගේ හා දෙමාපියන්ගේ යෝජනා**

<table>
<tr><th>වවුනියා</th><th>මුලතිවු</th></tr>
<tr><td>පහසුකම්/සේවාවන්</td><td></td></tr>
<tr><td colspan="2">පාසැලේ අවශ්‍ය පරිදි පානීය ජලය තිබීම හා එහි පිරිසිදු බව තහවුරු කිරීම</td></tr>
<tr><td colspan="2">කැන්ටිම් පහසුකම් - ඉඩකඩ ඇතිකම, පිරිසිදුකම හා ගුණාත්මක ආහාර සැපයුම</td></tr>
<tr><td colspan="2">අවශ්‍ය ජලය සමඟ සනීපාරක්ෂක පහසුකම්</td></tr>
<tr><td>ප්‍රමාණය මදි වන හෙයින් තිල ඇඳුම් සඳහා රෙදි</td><td>ගොඩනැගිලි ගුණාත්මකභාවය ප්‍රමාණවත් ඉඩකඩ සහිතව වැඩි දියුණු කළ යුතු වේ</td></tr>
<tr><td>ක්‍රීඩා පිට්ටනි</td><td>ප්‍රවාහන පහසුකම්</td></tr>
<tr><td>ඉගැන්වීම</td><td></td></tr>
<tr><td colspan="2">විෂයයන් සඳහා ගුරුවරුන් (පුහුණු ලද විශේෂඥ ගුරුවරුන්) හා සහායට කාර්ය මණ්ඩලයක් පත් කිරීම</td></tr>
<tr><td colspan="2">ගුරුවරුන්ගේ ක්‍රමවේද වැඩි දියුණු කිරීමට හැකියාවන් ගොඩනැංවීම/පුහුණුව අවශ්‍ය වේ</td></tr>
<tr><td>ගුරුවරුන් වෙලාවට පැමිණීම හා උගන්වන වේලාවන් අතරතුර ජංගම දුරකථන භාවිතය වැළැක්වීම</td><td></td></tr>
<tr><td>මූල්‍යය</td><td></td></tr>
<tr><td></td><td>අධ්‍යාපනය නොමිලේ සැපයිය යුතු අතර අමතර වියදම් වැළැක්විය යුතුය</td></tr>
</table>

# 3. ප්‍රධානතම නිගමන

මුලතිවු අධ්‍යාපන කලාපයේ හා වවුනියා දිස්ත්‍රික්කයේ උතුරු හා දකුණු අධ්‍යාපන කලාපයන් තුළ පිහිටි පාසැල්වල අධ්‍යාපන පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා මහ පෙන්වන ගැටළු කිහිපයක් සමීක්ෂණ තුළින් ඉස්මතු විය. අධ්‍යාපන බලධාරීන් විසින් අධ්‍යාපන යටිතල ව්‍යුහයන් පිළිබඳව පියවර කිහිපයක් ගනු ලැබෙනු අතර, දිස්ත්‍රික්කයන් දෙක තුළ අධ්‍යාපන ප්‍රතිඵල හා අත්දැකීම් වර්ධනය කිරීම උදෙසා ශිෂ්‍ය සුභසාධනය, ගුරුමණ්ඩලයේ ගුණාත්වය හා සිසුන්ගේ අයිතීන් පිළිබඳව සැලකිල්ල දැක්වීම සම්බන්ධව පවතින ගැටළු සඳහා සමව හෝ ඊටත් වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු වේ.

දිස්ත්‍රික්කයන් දෙකේම පාසැල් පැවතීම හා පිවිසුම යහපත් තත්ත්වයක පවතින නමුදු, පාසැල් භාවිතය පිළිබඳව ගැටලු පවතී, විශේෂයෙන්ම වවුනියාව තුළ. තම පෞද්ගලික මනාපයන් අනුව දෙමාපියන් තමන් උගත් පාසැල් වලටම දරුවන් යැවීම, වෙනත් පළාත්වල පිහිටි පාසැල් භාවිතයට හේතුදායක වන අතර, ගෘහයන් අසල පිහිටි පාසැල් තුළ ගුරුවරුන් සඳහා අඩුපාඩු ඇති හෙයින් අධ්‍යාපනය දුර්වල තත්ත්වයක පැවතීම හා පංති නොමැතිකම හා විෂයන් නොමැතිකම මඟින් දක්වන්නේ දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපන සේවාවන් සැපයීමේ අසමතාවක් පවතින වගයි. තවදුරටත් සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ, පාසැල් යාමේ නොහැකි තත්ත්වයක සිටිනා දරුවන් විසින්, ඔවුන් කෙදිනකවත් පාසැල් නොගිය බව දැක්වීමයි. මෙම සීමාවට ලක්වීමේ හේතුන් පිළිබඳව වැඩිදුරටත් අවබෝධය ලබා ගත යුතු වේ.

වවුනියාව (97%) තුළ අතිශයින්ම ඉහළ තෘප්ති මට්ටමක් හා ඊට සාපේක්ෂව මුලතිවු (78%) තුළ පහළ තෘප්ති මට්ටමක් දක්වමින් සමස්තයක් වශයෙන්, අධ්‍යාපන යටිතල ව්‍යුහයන් ඉතාමත් යහපත් තත්ත්වයක පවතී. යටිතල ව්‍යුහයන් සම්බන්ධව වවුනියාවේ සිසුන්ගේ ප්‍රධානතම ගැටලුව වනුයේ ක්‍රීඩා පිට්ටනි පිළිබඳවයි. ඔවුන්ගෙන් සියයට හතක ප්‍රතිශතයක් විසින් දක්වන්නේ ක්‍රීඩා පහසුකම් නොමැති හෙයින් ක්‍රීඩා උත්සව නොපවත්වන බවයි. මුලතිවු හි සිසුන්ගේ ප්‍රධානතම ගැටලු වනුයේ, පංතිකාමර පහසුකම් අප්‍රමාණවත් බැවින් ගස් යට පංති පැවැත්වීමට සිදුවීම හෝ වෙනත් පංති සමඟ මිශ්‍රව කටයුතු කිරීම හෝ වෙන් නොකරන ලද කාමර තුළ පංති පැවැත්වීම; පරීක්ෂණාගාර සහායකයන් හා විදුලි සැපයුම නොමැති හෙයින් විද්‍යාගාර සහ පරිඝණකාගාරයන් භාවිතා කිරීම අවම තත්ත්වයක පැවතීම; හා පාසැලේ ජලය ගුණයෙන් අඩුවීමය.

ගුරුවරුන් සමඟ පවත්වන අන්තර් සම්බන්ධතාව පිළිබඳව සිසුන් සතුට ප්‍රකාශ කරති. වාරයකට වරක්වත් සිසුන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගුරු-දෙගුරු රැස්වීම් පවත්වනු ලැබේ. සාමාන්‍ය වශයෙන් ඔවුන්ට සෑම විෂයක් සඳහාම (91%) ගුරුවරුන් සිටිනා බව හා විෂයන් සඳහා විශේෂ වූ (80%) ගුරුවරුන් ඔවුන්ගේ පාසැල් තුළ සිටිනා බව වවුනියාවේ සිසුන් දක්වන අතර, මුලතිවු හි සිසුන් දක්වන්නේ සෑම විෂයක් (65%) සඳහාම ඔවුන්ගේ පාසැල් තුළ ගුරුවරුන් නොමැති බව හා විෂයන් සඳහා (70%) විශේෂිත වූ ගුරුවරුන් අඩුව පවතින බවයි. දිස්ත්‍රික්කයන් දෙකේම සිසුන් දක්වන්නේ තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි හා විද්‍යාව යන විෂයන් සඳහා ගුරුවරුන් අප්‍රමාණවත් බවය. සිසුන් හා දෙමාපියන් දක්වන්නේ, ඵලදායී අධ්‍යාපනයක් සැපයීම උදෙසා ගුරුවරුන්ට ඉගැන්වුම් ක්‍රමවේදයන්ට අදාළ හැකියාවන් වර්ධනය කිරීමක් අවශ්‍ය වන බවය.

පවුල් තුළ අධ්‍යාපනය සඳහා වියදම් අවම කිරීමට ශ්‍රී ලාංකීය රජය විසින් සුභසාධන ක්‍රියාමාර්ගයන් කිහිපයක් ගනු ලැබීය. පාඩම් පොත්, නිල ඇඳුම් සඳහා රෙදි හා දිවා-ආහාර සැපයීම මීට ඇතුළත් වේ. මීට අමතරව, සිසුන් සඳහා වෛද්‍ය පරීක්ෂණ පහසුකම් ද සපයන ලදී. සමස්ත වශයෙන්, සිසුන් හා දෙමාපියන් මෙම සුභසාධන ක්‍රියාමාර්ගයන් අගය කොට සලකනු ලබන අතර, සමහරුන් ඒ පිළිබඳව සංවේග දක්වයි. වවුනියාවේ සැලකිය යුතු සිසුන් ප්‍රතිශතයක් (47%) දක්වන්නේ දිවා-ආහාර සපයන ක්‍රමවේදයක් ඔවුන්ගේ පාසැල් තුළ නොමැති බවයි. ප්‍රාදේශීය අධ්‍යාපන අධිකාරිය විසින් මෙයට හේතු නිර්ණය කළ යුතුය. වෛද්‍ය පරීක්ෂණ සඳහා පෙනී සිටි බවට දක්වන්නේ සිසුන් අඩු ප්‍රතිශතයක් වූ බැවින් (වවුනියාව තුළ 37% එරෙහිව 88%), මුලතිවු හි අධ්‍යාපන බලධාරීන් විසින් වෛද්‍ය පරීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සිදු කළ යුතුය.

ඉහත දක්වන ලද කරුණු වලට අමතරව, සිසුන් හා දෙමාපියන් පෙන්වා දෙන පරිදි අධ්‍යාපන බලධාරීන් විසින් පියවර ගත යුතු ගැටලු කිහිපයක් පද්ධතිය තුළ පවතී. ඒ සඳහා අයත් වන්නේ:

- සිසුන් දක්වන්නේ ගුරුවරුන් ප්‍රධාන වශයෙන් සිසුවාගේ අධ්‍යාපන මට්ටම පදනම් කොටගෙන වෙනස්කම් සිදු කරන අතර ඔවුන් සිසුවාගේ පවුලේ ආර්ථික තත්ත්වය හා සමාජ පසුබිමත් පදනම් කොට මෙසේ කරන බවයි. ගුරුවරුන් දක්වන මෙම උදාහරණය ඔස්සේ අනෙක් අය විසින් ද, විශේෂයෙන් සහෝදර සිසුන් විසින් ඔවුන්ට වෙනස්කම් සිදුවන බව වාර්තා වේ.

- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් එය නැවැත්වීම සඳහා ක්‍රියාමාර්ගයන් ගනු ලැබූ නමුදු, ශාරීරික දඬුවම් පමුණුවීම විශේෂයෙන්ම සිසුවියන්ට, නොනවත්වා සිදු කෙරේ.
- ප්‍රතිචාර දැක්වූ සිසුවන් සියල්ලම වාගේ ගැටලු ඇති බව සඳහන් කළ නමුදු, ඒ පිළිබඳව අදාළ පාසැල් බලධාරීන් හට වාර්තා කර ඇත්තේ ඉන් හතරෙන් එකක් පමණි. එයින් දක්වන්නේ, එය මගින් සිසුවන්ට අත්විය හැකි ඵලවිපාක පිළිබඳව දෙගිඩියාවක් නොමැතිව ගැටලු නිරාකරණයට පද්ධතිය තුළ හැකියාවක් නොමැති බවය.
- වාර්ෂික/පහසුකම් ගාස්තු වලට අමතරව වෙනත් අවශ්‍යතාවන් සඳහා සිසුන්ට මුදල් ගෙවීමට සිදුව ඇත. උත්සව සංවිධානය කිරීම, පාසැල් සංවර්ධනය හා ආරක්ෂක අරමුදල් වැන්නන් මීට අයත්වන අතර, එය අධ්‍යාපන අමාත්‍යාංශ නියමයන්ට විරුද්ධ වේ. කෙසේ වෙතත්, මෙහි ප්‍රධානතම ගැටළුව වන්නේ මෙම මුදල් ගෙවීමට සිසුනට බලහත්කාරකම් පෑමය. එසේ නොගෙවන්නන්ට පාසැල් තහනම හා විභාගයන් සඳහා පෙනී සිටීමේ තහනම වැනි දඬුවම් පමුණුවීමෙන් අධ්‍යාපනයට බලපෑමක් ඇති වන අතර එය නිදහස් අධ්‍යාපනයේ සංකල්පයට පිටින් යාමකි.

CRC භාවිතයෙන් සොයාගත් කරුණු සඳහා මුලතිවු අධ්‍යාපන කලාප කාර්යාලයේ හා දකුණු වවුනියා අධ්‍යාපන කාර්යාලයේ කළමනාකාරිත්ව ප්‍රතිචාර අනුපිළිවෙළින් ඇමුණුම 3 සහ ඇමුණුම 4 වශයෙන් දැක්වේ.

# 4 කලාපීය අධ්‍යාපන කාර්යාලයන්ගේ ප්‍රතිචාරය

පුරවැසි වාර්තා පතෙන් ලබාගත් තොරතුරු 2014 සැප්තැම්බර් මාසයේ දී මුලතිවු හා වවුනියා උතුරු හා දකුණු කලාපීය අධ්‍යාපන කාර්යාලයන් වෙත පිළිගන්වන ලදී. මුලතිවු අධ්‍යාපන කලාපීය කාර්යාලයේ සහ දකුණු වවුනියා අධ්‍යාපන කලාපීය කාර්යාලයේ කළමනාකාරත්ව ලිඛිත ප්‍රතිචාර අනුපිළිවෙළින් ඇමුණුම 3 හා 4 වේ.

අදාළ පරදු දරන්නන් සමඟ වැඩිතර සමුපදේශය, අධ්‍යාපන පහසුකම්වල ගුණාත්වය හා විශ්වාසනීයත්වයේ වැඩිදියුණුව (උදා: සේවක පුරප්පාඩු පිරවීම, පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණුව හා මධ්‍යාහ්න ආහාරය වැනි රජයේ පිහිටාධාරලත් ශිෂ්‍ය සුභසාධන ඉවැඩි කිරීම), ශාරීරික දඬුවම් පමුණුව හා අපයෙදුම්/වෙනස්කම් අවම කර ඉවත් කිරීම සඳහා පියවර ගැනීම සහ පාසැල් තුළ මූල්‍ය විධිනියම තරයේ අනුගමනය තහවුරු කිරීම තුළින් අධ්‍යාපන සේවාවන් වෙත පිවිසුමේ වැඩිදියුණුවක් ඇති කෙරුම මෙම ප්‍රතිචාරයන් තුළින් ආවරණය වේ. කාර්යාලයන් දෙකෙහි ප්‍රමුඛතා වෙනස් ආකාරයක් දක්වයි. මුලතිවු අධ්‍යාපන කලාපීය කාර්යාලය අධ්‍යාපන සේවා පිවිසුම සඳහා ප්‍රමුඛත්වය දීමට බලාපොරොත්තු වන අතර දකුණු වවුනියා අධ්‍යාපන කලාපීය කාර්යාලය ශාරීරික දඬුවම් පමුණුව ඉවත් කිරීම සඳහා ප්‍රමුඛත්වය දීමට බලාපොරොත්තු වේ.

# ඇමුණුම 1: පුරවැසි වාර්තා පත

## පුරවැසි වාර්තා පත යනු කුමක් ද?

පූර්ව-දුගී සේවාවන් ලබා ගැනීම හා එහි ප්‍රතිලාභ පිළිබඳව ප්‍රයෝගසිද්ධ "නොසැඟවූ" තක්සේරුවක් CRC මගින් සපයනු ලැබේ. පොදු සේවාවන් වෙත යොමුවීම සඳහා පුරවැසියන් මුහුණපාන සීමාවන් හඳුනාගැනීමට මෙන්ම සේවාවන්ගේ ගුණත්වය හා ප්‍රමාණවත්කම සහ මෙම සේවාවන් සපයන්නන්ගේ කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව මිණුමට එය ඉවහල් වේ. අංශ ප්‍රතිපත්තීන් නිර්දේශ කිරීම, සේවාවන් සැපයුමේ උපක්‍රම සහ කළමනාකරණය සැකසීම හා මෙම සීමාවන් අමතා සේවාවන් සැපයුම වැඩි දියුණු කිරීම සඳහා මෙම අන්තර්දෘෂ්ටි සහාය දක්වයි.

විවිධ පොදු සේවාවන් (උපයෝග) භාවිතා කරන්නන්, හා භාවිතා කරන්නන්ගේ අත්දැකීම් සම්භාරයන් පිළිබඳව නියැදි සමීක්ෂණයක් පවත්වා එය සේවාවන් ඇගයුමට පදනම වශයෙන් පුරවැසි වාර්තා පතට ඇතුළත් කරනු ලැබේ. විවිධ වැඩ සටහන් වලදී තනි පුද්ගලයන් මුහුණපාන ගැටලු අංශයන්ගේ පොදු ගැටළු බවට පරිවර්තනය කිරීමට ද CRC සහාය වේ. ඉස්මතු කරනා අමාරුම ගැටලු වෙත අවධානය යොමුකර ප්‍රතිසංස්කරණයන් හා ප්‍රතිකාරක ක්‍රියාවන්ට ප්‍රමුඛතාවක් ඇතිකිරීමට එය පහසුකම් සලසති. හොඳ පුරුදු හඳුනා ගැනීම තුළින් අදහස් හුවමාරුව හා පිවිසුම සඳහා CRC මගින් පහසුකම් සැලසේ.

භාවිතා කරන්නන්ගේ අත්දැකීම් ඇසුරෙන් පොදු සේවාවන්ගේ ගුණාංග සම්බන්ධව පුරවැසි වාර්තා පත් මගින් මිණුම් ලකුණක් සපයනු ලැබේ. එහෙයින්, නිලධාරීන්ට ඒ සඳහා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන්ගේ මුල පිරුම සඳහා, ඔවුන් ඒ ඒ පුරවැසියන් මුහුණපෑමට ඉඩ ඇති ඒ ඒ ගැටලු වලින් ඔබ්බට ගොස්, එම ගැටලු අනෙකුත් සේවාවන්ගේ දෘෂ්ටිකෝණයේ තබනවා මෙන්ම අනෙකුත් සේවාවන් සමඟ සංසන්දනය කිරීමක් ද සිදු කරති.

වාර්තා පත් විසින් පුරවැසියන්ගේ තෘප්තිතා හෝ අතෘප්තිතා මට්ටම් දැක්වීම ඔස්සේ ඔවුන්ගේ ප්‍රතිචාර සරල හා පැහැදිලි අන්දමින් ග්‍රහණය කරති. උදාහරණ වශයෙන්, පානීය ජල සැපයුම පිළිබඳව පුරවැසියෙකුට දිය හැකි පැහැදිලිම ප්‍රතිචාරය වනුයේ පූර්ණ අතෘප්තිතාවයි. මෙම ප්‍රතිචාර වටහා ගැනීම සඳහා, අප එය එම තැනැත්තා විසින්ම අනෙක් මානයන් වෙත ලබා දී ඇති තක්සේරුවන්ට අදාළ කළ යුතු වේ. උදාහරණ වශයෙන්, ජලයේ ප්‍රමාණවත් බව එහි ගුණාත්මක බවට වඩා අඩු බවට තක්සේරු කළ හැක. අප මේ තොරතුරු දෙක දිහා බලන විට, සපයන ජලයේ ගුණාත්මක බව අතෘප්තිතාවය සඳහා හේතුවක් විය හැකි බව අපට තීරණය කළ හැක. නමුත්, ප්‍රමාණවත් අන්දමින් ජලය සැපයීම මෙයට ප්‍රතිකාරක ක්‍රියාමාර්ගයක් සඳහා ප්‍රමුඛතාව විය හැකිය. එනිසා, පොදු සේවාවන්ගේ විවිධ මානයන් හරහා දක්වන පුරවැසි තෘප්ති මට්ටම් පිළිබඳ මිණුම්, වාර්තා පත් අධ්‍යයනයේ මධ්‍යය සංස්ථාපනය කරයි.

පුරවැසි වාර්තා පත් තෘප්තිතා මට්ටම් පිළිබඳ වූ මිණුම් වලින් පමණක් නතර නොවේ - ඔවුන් සේවා නියෝජිත ආයතනය සහ පුරවැසියා අතර අන්තර්ක්‍රියාවන්ගේ විශිෂ්ට අංගයන් පිළිබඳව සෝදිසි කර, එවැන්නන් පිළිබඳව මතුවන ගැටලු හඳුනා ගැනීමට වෑයම් දරති. සරල වශයෙන් කියතොත්, අතෘප්තිතාවට හේතු ඇති බව ඔවුන් පෙන්වා දෙන අතර පුරවැසියා ලබා ගන්නා සේවාවේ ගුණාත්මක භාවය (ජල සැපයුමේ විශ්වාසනීයතාව, හෝ පොදු පාසැලක ඉගෙනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය තිබීම යනාදිය), සේවාවන් සම්බන්ධව ගැටළු විසඳීමට නියෝත ආයතනය සමඟ කටයුතු කිරීමේ දී මුහුණපාන අපහසුතා (ජල සැපයුම බිඳවැටීම පිළිබඳ පැමිණිලි කිරීම යනාදිය), හා පොදු සේවාවන් භාවිතය සඳහා වූ සැඟවුණු ගාස්තු (අමතර පංති සඳහා ගුරුවරුන්ට විශේෂ ගාස්තු හෝ "පානීය ජලය" පවිත්‍ර කිරීමට ආයෝජනය යනාදිය) ඒ සඳහා අදාළ විය හැක. එහෙයින්, පොදු සේවාවන් තුළ පවතින ගැටලු පෙන්වා දීම සඳහා පුරවැසියන් සමඟ කටයුතු කිරීමේ දී ඇති විවිධ කාර්ය සාධන දර්ශන නිරීක්ෂණය කිරීම දක්වා වාර්තා පත් අධ්‍යයනයන් කෙරීගෙන යන බව අපට දක්නට ඇත.

වාර්තා පත් අධ්‍යයනය දැනට පවතින තත්ත්වයන් පිළිබඳව පුරවැසියන්ගේ ප්‍රතිචාර රැස්කිරීමේ ක්‍රමයක් පමණක් නොව. පවතින ගැටලු විසඳීම සඳහා පුරවැසියන්ට වෙන් වශයෙන් හෝ සාමූහිකව වෙනත් විකල්ප අත්හදා බැලීම සඳහා ද මෙය හොඳ උපක්‍රමයකි. උදාහරණ වශයෙන්, පොදු ජල කළමනාකරණය සඳහා වැඩිපුර ගෙවීමට හෝ ඒ සඳහා වූ පුරවැසියන්ගේ මණ්ඩලයට එකතුවීමට පුරවැසියන්ගේ එකඟතාවය. එහෙයින්, පොදු සේවාවන්ගේ වැඩි දියුණුව තකා පුරවැසියන්ගේ විකල්ප විමසීම සඳහා ද වාර්තා පත් හොඳ උපක්‍රමයක් වේ.

වාර්තා පතක වැදගත් දර්ශයක් වනුයේ ඒ සඳහා මෙතෙක් ලබා ඇති විශ්වාසනීයත්වය යි. වාර්තා පතක ඇති නිගමනයන්, යම් ආකාරයකින් පමණක් සිතන සුළු පිරිසකගේ අදහස් හෝ, පීඩාවට පත් සුළු

පුරවැසියන් පිරිසකගේ පැමිණිලි මත නිර්මාණය වූවන් නොවේ. එහි ක්‍රමවේදයට අනුව සියළුම අතුරු කොට්ඨාශයන් හෝ පුරවැසි ඛණ්ඩයන් හරහා ක්‍රමවත් නියැදීමක් සම්බන්ධ කර - තෘප්තියට පත් අයගේ මෙන්ම පීඩාවට පත් අයගේ ඇතුළත් වූ - සියළුම මතයන් සහිත දර්ශනයක් ඉදිරිපත් කරති. මෙම ක්‍රමවේදය මගින් උදාහරණ තෝරා ගැනීම, ප්‍රශ්නාවලි නිර්මාණය කිරීම, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, හා ප්‍රතිඵල පරිවර්තනය කිරීම සඳහා දියුණු වූ සමාජ විද්‍යා පර්යේෂණ ශිල්පක්‍රම භාවිතා කරන හෙයින් මෙසේ කිරීමේ හැකියාවක් පවතී. ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තා පත් පුරවැසි ප්‍රතිචාරයන් සඳහා හොඳ නියෝජිතයකි.

## පුරවැසි වාර්තා පත් ප්‍රතිචාර

පොදු සේවාවන්ගේ ක්‍රියාකාරිත්වයන් තක්සේරු කිරීම උදෙසා පවත්වන පුරවැසි ප්‍රතිචාර සමීක්ෂණ පිළිබඳ සංකල්පය සීඝ්‍ර වශයෙන් පුළුල් පිළිගැන්මකට ලක් වූවකි. වාර්තා පත් සඳහා ප්‍රතිචාර දැක්වීම මට්ටම් හතරකින් බලපෑම් දක්වයි:

උනන්දු උපදවන ප්‍රතිසංස්කරණ: වාර්තා අධ්‍යයනයන් මගින් පොදු සේවාවන් සපයන්නන්ට ප්‍රබල පණිවුඩයක් යැවූ, ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව පිළිබඳ පුළුල් ගැටලු සම්භාරයක් පැහැදිලි වශයෙන් එළි දැක්වූහ. ප්‍රමාණිත පරිමාණය භාවිතය තුළින්, ප්‍රතිචාර දැක්වූවන්ට නියෝත ආයතනයක මෙන්ම, සේවා සපයන විවිධ මානයන්ගේ සේවාවන් සම්බන්ධව ඔවුන්ගේ තෘප්තිතාවේ හෝ අතෘප්තිතාවේ පරිමාණය දැක්වීමට අවස්ථාව ලැබුනි. වාර්තා පතින් ඉඩ සැලසෙන අන්තර්-නියෝජිත ආයතන සැසඳුම් මගින්, වාචිකව සිදු කළ නොහැකි මාදිලියේ අවධානයක් ඇති කිරීම සඳහා පරිමාණයක් හා තරාතිරමක් දැක්වීමේ හැකියාවක් ඇති කරයි.

පරදු දරන්නන්ගේ ප්‍රතිචාර සක්‍රිය කිරීම: බොහෝ නියෝජිත ආයතනයන්, වාර්තා පත මගින් සොයාගත් තොරතුරු වැඩිදුර අධ්‍යයනය හා අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ ක්‍රියාරම්භ කිරීම සඳහා හේතුනිර්ණක මෙවලමක් වශයෙන් භාවිතා කලහ. තාක්ෂණික විස්තරයන්ගෙන් තොරව සරල හා සෘජු අන්දමකට පුළුල් පරාසයක් හරහා පරිපාලනයේ කාර්යක්ෂමතාව මන්තු කිරීමට, මෙම සොයාගත් තොරතුරු ජ්‍යෙෂ්ට නායකත්වයට සහාය දක්වති. වැඩි සැලකිල්ලක්, අධීක්ෂණයක් හා අයෝජනයක් අවශ්‍ය තැන්වල සේවා සැපයුමේ දර්ශයන් පිළිබඳ අන්තර්දෘෂ්ටියක් මෙය විසින් පරිපාලකයන් සහ සැලසුම්කරුවන් හට ලබා දේ.

රාජ්‍ය - පොදු හවුල් ව්‍යාපාර ජංගනය: සම්මන්ත්‍රණ සහ රැස්වීම්, රජයේ නිලධාරීන් හා සිවිල් සමාජ නියෝජිතයින් යන දෙපක්ෂයේම සම්බන්ධය ඇතුව වාර්තා පත් මගින් සොයාගත් තොරතුරු ප්‍රචාරණයේ අනුකලන කොටසකි. පොදු සේවා සපයන නියෝජිත ආයතනයන්ගෙන් ප්‍රමුඛතා පළාත් තුළ වැඩි දියුණුව සඳහා ඉල්ලුම් කරනා අතර, වාර්තා පත් මගින් මෙම අවදානම් සහිත කොටසට සැලකිල්ලට ලක් විය යුතු ගැටලු වෙත අවධානය යොමු කිරීම සඳහා පහසු මෙවලමක් ලබා දී, වාචික හා විෂයාත්මක ගැටලු වෙතින් බැහැරව ගොස් පරිසිද්ධි සහ සංඛ්‍යා වෙත යොමු වීමට උනන්දුව ඇති කලහ. එය විසින් මෙම කණ්ඩායම් හට සේවා සපයන්නන්ගේ කාර්යයන් සඳහා ඇති සීමා වටහා ගැනුමට මෙන්ම, ගැටලු නිරාකරණය සඳහා ප්‍රජා ආරම්භක විකල්ප විපරම් කිරීමට ද අවස්ථාව සපයනු ලැබේ.

කෙටියෙන් කියතොත්, CRC මගින් ලබාගත් මෙම අන්තර්දෘෂ්ටියන් තුළින් පූර්ව-දුගී සේවාවන් ඉලක්ක කණ්ඩායම් වෙත ළඟාවීම, සේවා සැපයුම් පරතරයේ ප්‍රමාණත්වය, හා සම්පත් හා සේවාවන්ගේ අවනිර්දේශයට දායක වන කරුණු යනාදියේ මට්ටම් පහදා දිය හැක. ලබාගැනීමේ හැකියාව, පිවිසීමේ පහසුව, ගුණාත්මක භාවය, විශ්වාසනීයත්වය හා වියදම් යනාදී, දුගියන් හට සේවාවන් වෙත පිවිසුම හා භාවිතය සීමා කරවන ගැටලු හඳුනා ගැනීමට එය සහාය වේ. සක්‍රිය ලෙස පුරවැසියන්ගෙන් යෝජනා විමසා සේවා සැපයුම වැඩි දියුණු කිරීමට හැකි ක්‍රම හඳුනා ගැනීම සඳහා ද CRC සහාය දක්වයි. අවසන් වශයෙන්, CRC මගින් සොයාගත් තොරතුරු, වෙනත් විශ්ලේෂක අධ්‍යයනයන් තුළින් ලද ප්‍රතිපත්ති නිගමනයන් කිහිපයක්, පුරවැසි දෘශ්ටිකෝණයෙන් අත්හදා බැලීමට සහාය වේ.

# ඇමුණුම 2: CRC ගෘහස්ථ ප්‍රශ්නාවලිය

ආයුබෝවන්,

දිළිඳුකම් විශ්ලේෂණය පිළිබඳ වූ මධ්‍යස්ථානය මඟින්, උතුරු පළාතේ පිහිටි මුලතිවු සහ වවුනියා දිස්ත්‍රික්කයන් තුළ නිදහස් අධ්‍යාපන සේවාවන් පමුණුවීමේ කාර්යාවලිය තක්සේරු කිරීම සඳහා පුරවැසි වාර්තා පත් ක්‍රමවේදය භාවිතාකොට, අධ්‍යාපනය පිළිබඳ මූලික අධ්‍යයනයක් පවත්වනු ලැබේ.

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමට සහාය වීම සඳහා ස්වේච්ඡා සේවකයෙකු වශයෙන්, ACTED හා CEPA විසින් මාව මාව පත්කරන ලදී. අප ප්‍රධාන වශයෙන් උනන්දු වන්නේ, ඔබගේ අත්දැකීම්, අධ්‍යාපන සේවාව පිළිබඳ ඔබේ මතයන්, අත්වන අභියෝග හා කම්පන/අපහසුතා සහ ඔබ එයට මුහුණපාන ආකාරය පිළිබඳවයි. අප පැමිණීමට බලාපොරොත්තු වන ගෘහස්ථය තීරණය කිරීමට අනුගමනය කරන්නේ අහඹු තේරීම් ක්‍රියා පිළිවෙළක් වන අතර ඔබේ නිවහන ද එසේ තෝරන ලද්දකි. ඔබට අප සමඟ කතාබහ කිරීමට හැකිවේ ද? ඒ සඳහා ගත වන්නේ පැයක පමණ කාලයක් පමණයි.

මෙම අධ්‍යයනය ඔස්සේ අප බලාපොරොත්තු වන්නේ, අධ්‍යාපන සේවාවන් සැපයීමේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා ගන්නා තීරණයන්ට මෙහි ප්‍රතිඵල මඟින් බලපෑමක් ඇති කිරීමටය.

ඔබ අප සමඟ බෙදාගන්නා තොරතුරු සියල්ලම කිසිවෙකුටත් හෙළි නොකර අතිශයින්ම රහසිගතව තබා ගන්නා බවට අප සහතික වෙමු. මෙම අධ්‍යයනය සඳහා ඔබගේ සහභාගිත්වය අතිශයින්ම ස්වේච්ඡා සහගත වන අතර, ඔබට කැමති ඕනෑම අවස්ථාවක සාකච්ඡාව නැවැත්වීමට අයිතිය ඇත.

| | | |
|---|---|---|
| අනුගණකයාගේ නම<br>ජංගම දුරකථන අංකය : | | ප්‍රතිචාර දක්වන්නා පිළිතුරු නොදන්නේ නම්,<br>999 සංකේතය සටහන් කරන්න<br><br>ප්‍රශ්නයක් අදාළ නොවන්නේ නම්,<br>888 සංකේතය සටහන් කරන්න<br><br>ප්‍රතිචාර දැක්වීමට අකමැති නම්,<br>777 සංකේතය සටහන් කරන්න |
| ක්ෂේත්‍ර කාර්යය අධීක්ෂකයාගේ නම | | |
| දිනය<br>දිනය/මාසය/වසර | | |

| වේලාව | |
|---|---|
| **අවසන් වූ ආරම්භක වේලාව** | |
| | |
| **දත්ත නිවැරදි කරන ලද්දේ** | |
| **දත්ත පරීක්ෂා කරන ලද්දේ** | |
| **දත්ත ඇතුළත් කරන ලද්දේ** | |
| **දත්ත ඇතුළත් කළ දිනය** | |

## මූලික පූර්ව-සම්මුඛ පරීක්ෂණ දත්ත........

| | | | |
|---|---|---|---|
| **A.1** | <u>ගෘහස්ථ හැඳුනුම</u> | | |
| **A.2** | <u>ලිපිනය</u> | දිස්ත්‍රික්කය | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| | | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | |
| | | ග්‍රාමය/නගරය/දිසාව | |
| | | වීදිය | |
| **A.3** | <u>ස්ථානය</u><br><br>සොයාගැනීමට පහසු වන පරිදි සලකුණු දක්වන්න (උදා. මංසලකුණු) | | |
| **A.4** | <u>නාගරික/ග්‍රාමීය තත්ත්වය</u><br><br>නාගරික 1<br>ග්‍රාමීය 2 | | |
| **A.5** | <u>සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵලය</u><br><br>සම්පූර්ණ කළ=1<br>සම්පූර්ණ කළ=2<br>සහභාගීවීමට ප්‍රතික්ෂේප කළ=3 (A.6 වෙත යොමු වන්න) | | |
| **A.6** | <u>ප්‍රතික්ෂේප කිරීමට හේතුව</u><br><br>කාලය නොමැත=1<br>කැමැත්තක් නැත=2<br>වෙනත්=3 (පැහැදිළිව දක්වන්න) | | |
| **A.7** | <u>ප්‍රතිචාර දක්වන්නාගේ නම</u> | | |
| **A.8** | <u>ප්‍රතිචාර දක්වන්නාගේ දුරකථන අංකය (ජංගම)</u> | | |

## මූලික ගෘහස්ථ තොරතුරු

| **ඔබගේ ගෘහස්ථයේ සංක්‍රමණය පිළිබඳ<br>ප්‍රශ්න කිහිපයක් අසමු.** | | |
|---|---|---|
| B.1 | ඔබ මෙම ග්‍රාමයේ/ප්‍රජාවේ උපන්දා සිටම වෙසෙන්නේ ද?<br><br>*නැත=0 (B.2 වෙත යොමු වන්න)*<br>*ඔව්=1 (B.4 වෙත යොමු වන්න)* | |
| B.2 | ඔබ උපන්දා සිට මෙහි පදිංචිව නොසිටියේ නම්, ඔබ මෙහි ජීවත් වන්නේ ප්‍රථම වතාවටද, එහෙත් නැතිනම් මීට පෙරාතුව ඔබ මෙහි ජීවත් වූයේද?<br><br>*ප්‍රථම වතාව=1*<br>*මීට පෙරාතුව මෙහි ජීවත් වූවා=2* | |
| B.3 | ඔබ මෙහි පදිංචියට ආ ප්‍රධාන හේතුව කුමක් ද? (එක් උත්තරයක් පමණක් දක්වන්න)<br><br>*අකමැත්තෙන් ප්‍රතිවාසනය=1*<br>*ආර්ථික වාසි සඳහා අවස්ථා පැදුනු හෙයින් ස්වේච්ඡාවෙන්ම පැමිණියා=2*<br>*විවාහය හේතුවෙන් පැමිණියා=3*<br>*ආරක්ෂක හේතූන් මත පැමිණියා=4*<br>*වෙනත් හේතූන් නිසා ස්වේච්ඡාවෙන්ම පැමිණියා=5 (පැහැදිළිව දක්වන්න)* | |
| B.4 | ඔබව කවදා හෝ අවතැන් කර තිබේ ද?<br><br>*නැත=0 (B.10 වෙත යොමු වන්න)*<br>*ඔව්=1 (B.5 වෙත යොමු වන්න)* | |
| B.5 | ඔබව කී වතාවක් අවතැන් කර තිබේ ද? (වාර ගණන සඳහන් කරන්න) | |
| B.6 | ඔබව අවතැන් කරන ලද්දේ කවදා ද? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)<br><br>*1990 ට පෙර=1*<br>*1990 සහ 2000 අතර=2*<br>*2001 සහ 2005 අතර=3*<br>*2006 සහ 2009 අතර=4*<br>*2009 ට පසුව=5*<br>*මතක නැත/නොදනී=999* | |
| B.7 | අවතැන් කිරීම සඳහා වූ හේතු කුමක්ද? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)<br><br>*යුද්ධය=1*<br>*සුනාමි=2*<br>*ගංවතුර/වෙනත් ස්වභාවික විපත්=3*<br>*වෙනත්=4 (පැහැදිළිව දක්වන්න)* | |
| B8 | ඔබ අවතැන්කළ පසු නැවත පදිංචි කරන ලද්දේ ද නැතිනම් තවමත් අවතැන්ව ද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br><br>*ඉවත්කර නැවත පදිංචි කරන ලදී=1*<br>*තවමත් සිටින්නේ අවතැන්ව=2* | |

| | | |
|---|---|---|
| B9 | එකතු වශයෙන් ඔබ කොපමණ කාලයක් අවසන් අවතැන් වීමෙන් පසු නැවත පදිංචි වූයේද/වන්නේද (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br><br>*2000 ට පෙර=1*<br>*2000 සහ 2003 අතර=2*<br>*2003 සහ 2006 අතර=3*<br>*2006 සහ 2009 අතර=4*<br>*2009 සහ 2012 අතර=5*<br>*2012 ට පසුව=6*<br>*මතක නැත/නොදනී=999* | |

| | | |
|---|---|---|
| **ඔබගේ ගෘහස්ථයේ ආගම සහ ජනවාර්ගිකත්වය පිළිබඳ ප්‍රශ්න කිහිපයක් අසමු........** | | |
| B.10 | ඔබගේ ගෘහස්ථයේ පවතින ආගම කුමක් ද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br><br>*බෞද්ධාගම=1*<br>*හින්දු ධර්මය=2*<br>*කතෝලික ධර්මය=3*<br>*ක්‍රිස්තු ධර්මය=4*<br>*ඉස්ලාම් ධර්මය=5*<br>*මිශ්‍රිත=6*<br>*වෙනත්=7 (පැහැදිළිව දක්වන්න)* | |
| B.11 | ගෘහස්ථය අයත් වන්නේ කිනම් ජනවර්ග සමූහයට ද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br><br>*සිංහල=1*<br>*ශ්‍රී ලාංකීය දමිළ=2*<br>*ශ්‍රී ලාංකීය මුස්ලිම්=3*<br>*ඉන්දීය දමිළ=4*<br>*මිශ්‍ර=6 (පැහැදිළිව දක්වන්න)* | |

## මූලික තනිපුද්ගල තොරතුරු

ගෘහස්ථ සාමාජිකයින් සඳහා වූ වගුව සම්පූර්ණ කරන්න. පසුගිය වසර තුළ අවම වශයෙන් මාස තුනක කාලයක්, එකට උපයා කා, බී ජීවත්වන අය ද ගෘහස්ථ සාමාජික සනයට අයත් වේ.

| C.1<br>PID No | C.2 ගෘහස්ථ සාමාජිකයින්ගේ නම්<br>ප්‍රතිචාරකයා හා සබැඳියාව?<br>ප්‍රතිචාරකයා = 1<br>විවාහක සහකරු =2<br>දියණිය/පුත්‍රයා =3<br>දියණිය/පුත්‍රයාගේ විවාහකයා =4<br>මුනුබුරා/මිනිබිරිය =5<br>මව/පියා =6<br>සහෝදරයා/සහෝදරිය =7<br>ඥාති පුතා/ඥාති දියණිය =8<br>මාමණ්ඩි/නැන්දම්මා =9<br>මස්සිනා/නෑනා =10<br>වෙනත් ඥාතී =11<br>ඥාතී නොවන =12 | C.3<br>ස්ත්‍රී/ පුරුෂ භාවය<br>පුරුෂ =1<br>ස්ත්‍රී=2 | C.4<br>වයස<br>(අවුරුද්දක ට අඩු නම් පහත 00 දක්වන්න) | C.5<br>විවාහක තත්වය<br>විවාහක (ලියාපදිංචි)=1<br>අවිවාහක=2<br>එක්ව ජීවත් වන=3<br>වෙන් වූ=4<br>දික්කසාද වූ=5<br>වැන්දඹු/විදුර=6 | C.6<br>පාසැල් යන වසර ගණන<br>පාසැල් නොයන=0<br>1-10 අතර වසර දක්වන්න<br>සා/පෙ සුදුසුකම් ලද=11<br>උ/පෙ=12<br>උ/පෙ සුදුසුකම් ලද=13<br>සරසවි=14<br>වෘත්තීමය=15<br>වෘත්තීමය පුහුණු=16 | C.7<br>වයස 18 ට අඩු වූ නමුත් පාසැල් නොයන්නේ නම්, හේතු දක්වන්න<br>පාසැල් යාමට වයස මදි=1<br>ආබාධිත=2<br>ගෘහ පාලනය=3<br>වැඩකරන=4<br>ආර්ථික ප්‍රශ්න=5<br>යාමට අකමැති=6<br>දුර්වල ශාස්ත්‍රීය ප්‍රගතිය=7<br>පාසැල දුරින් පිහිටීම=8<br>වෙනත්=8 (පැහැදිළි කරන්න)<br>වයස 18 න් පහළ ගෘහස්ථ සාමාජිකයින්ගෙන් පමණක් විමසන්න | C.8<br>නිවසින් පිටත ජීවත්වන ගෘහස්ථ සාමාජිකයින් සිටින්නේ ද?<br>1. එතෙර<br>2. එකම දිස්ත්‍රික්කයේ<br>3. වෙනත් දිස්ත්‍රික්කයක<br>4. නිවසෙහි ජීවත් වන | C.9<br>පසුගිය මාස හය තුළ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්<br>රැකියා නිරත=1<br>රැකියා විරහිත (රැකියා සොයන)=2<br>ගෘහස්ථ වැඩ=3<br>රැකියා සඳහා වයස වැඩි=4<br>ආබාධිත/රෝගාතුර=5<br>වැටුප් නොලද ක්‍රියා=6<br>වෙනත්=7 (පැහැදිළි කරන්න)<br>ඉගෙනුම ලබන=8<br>විශ්‍රාම ලද=9 |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |
| 9 | | | | | | | | |
| 10 | | | | | | | | |

## A. වත්කම්

| නිවාස හිමිකම | | |
|---|---|---|
| D.1 | නිවාසයේ හිමිකම් තත්ත්වය කෙසේද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br>හිමිවේ, ඔප්පු/ලියකියවිලි ඇත=1<br>හිමිවේ, නමුත් ඔප්පු නොමැත=2<br>කුලී පදනම මත=3<br>නොමිලේ වාසය=4<br>ලේඛනගත නොවූ ඉඩමක=5<br>වෙනත්=6 (පැහැදිලි කරන්න) | |
| D.2 | ඔබ ජීවත්වන නිවස ඔබ විසින්ම ගොඩනැගුවක් ද එසේ නැතිනම් යම් සංවිධානයකින් ආධාර ලැබුණා ද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br>මා විසින්ම ගොඩනැගූ=1<br>සංවිධානයක් මගින් ගොඩනැගූ=2<br>අඩක් මා විසින් ඉතිරිය සංවිධානයක් මගින්=3<br>වෙනත්=4 (පැහැදිලි කරන්න) | |
| ඔබ ජීවත්වන නිවහන පිළිබඳව ප්‍රශ්න කිහිපයක් අසමු............. | | |
| D.3 | වහල සාදා ඇත්තේ කුමකින් ද? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)<br>ටයිල්=1<br>ඇස්බැස්ටස්=2<br>කොන්ක්‍රීට්=3<br>ලෝහ තහඩු=4<br>පොල් අතු=5<br>වයිනයිල් තහඩු=6<br>ඉටි රෙදි=7<br>වෙනත්=8 (පැහැදිලි කරන්න) | |
| D.4 | ඔබේ බිත්ති සාදා ඇත්තේ කුමකින් ද? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)<br>ගඩොල්=1<br>සිමෙන්ති බ්ලොක්=2<br>ගල්=3<br>කබොක්=4<br>මැටි බ්ලොක්=5<br>ලෑලි=6<br>ලෝහ තහඩු=7<br>මඩ=8<br>පොල් අතු=9<br>ඉටි රෙදි=10<br>වෙනත්=11 (පැහැදිලි කරන්න) | |
| D.5 | ඔබේ පොළොව සාදා ඇත්තේ කුමකින් ද? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)<br>ටයිල්=1<br>සිමෙන්ති=2<br>පස්=3<br>මැටි=4<br>වෙනත්=5 (පැහැදිලි කරන්න) | |
| D.6 | ඔබට වැසිකිළියක් තිබේ ද?<br>නොමැත=0<br>ගෙතුළ පෞද්ගලික භාවිතයට=1<br>ඉඩම තුළ පෞද්ගලික භාවිතයට=2<br>අසල්වැසි වැසිකිළියක් භාවිතා වේ=3 | |
| D.7 | පිසීම සඳහා භාවිතා කරන ප්‍රධාන බලශක්තිය කුමක් ද? (එක් පිළිතුරක් පමණක් දක්වන්න)<br>විදුලි බලය=1<br>ස්වභාවික වායු=2<br>භූමිතෙල්=3<br>අඟුරු=4<br>දැව=5<br>ගොම=6<br>කෘෂි වගා අපද්‍රව්‍ය හෝ පිදුරු=7<br>වෙනත්=8 (පැහැදිලි කරන්න) | |

| අප දැන් ඔබගේ ගෘහස්ථ භාණ්ඩ, පශු සම්පත්, උපකරණ හා ප්‍රවාහනය පිළිබඳව ප්‍රශ්න කිහිපයක් අසන්නෙමු | | | |
|---|---|---|---|
| | පහත සඳහන් භාණ්ඩ ඔබේ ගෘහස්ථයේ තිබේද.........? | නැත=0<br>ඔව්=1<br>A | **කොපමණද? (ඇතුළත ලියන්න)<br>B** |
| **S/N** | **ගෘහස්ථ භාණ්ඩ** | | |
| D8.1 | ශීතකරණය | | |
| D8.2 | රූපවාහිනිය | | |
| D8.3 | ජංගම දුරකථනය | | |
| D8.4 | විදුලි පංකාව/වායුසමීකරණය | | |
| D8.5 | පරිගණකය/ලැප්ටොප් පරිගණකය | | |
| **S/N** | **පශු සම්පත්** | | |
| D9.1 | කුඩා ප්‍රමාණයේ පශු සම්පත් (උදා: කුකුළු යනාදිය) | | |
| D9.2 | මධ්‍යම ප්‍රමාණයේ පශු සම්පත් (උදා: එළුවන් යනාදිය) | | |
| D9.3 | මහා ප්‍රමාණයේ පශු සම්පත් (උදා: ගවයන්, මී හරක්) | | |
| **S/N** | **ප්‍රවාහණය** | | |
| D10.1 | මිනිස් බලයෙන් පන ගන්වන වාහන (උදා: යතුරුපැදි, අත්කරත්ත) | | |
| D10.2 | පැට්‍රෝල් බලයෙන් පන ගන්වන වාහන (උදා: යතුරුපැදි, මෝටර්රථය, ට්‍රක්රථය) | | |

**ගෘහමූලිකයා සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වනු ලැබේ.**

## 1 සේවාව සඳහා පිවිසුම

| අනු අංකය | ප්‍රශ්නය | ප්‍රතිචාරය | සංකේතය | යොමුව |
|---|---|---|---|---|
| 1.1 | ඔබේ දරුවන් කී දෙනෙකු පාසැල් යන්නේ ද? | 1<br>2<br>3<br>4<br>4> | 1<br>2<br>3<br>4<br>5 | |
| 1.2 | ඔබ ග්‍රාමයේ පාසැලක් තිබේද? | නැත<br>ඔව් | 0 →<br>1 | 1.6 වෙත යොමු වන්න |
| 1.3 | පාසැලේ නම(ම්) කුමක් ද? | | | |
| 1.4 | ඔබේ දරුවා/දරුවන් ඔබ ග්‍රාමයේ තිබෙන එම පැසැලට යනවා ද? | නැත<br>ඔව්<br>වෙනත් (දරුවන් වෙන වෙනම පාසැල් වල) | 0 →<br>1<br>2 | 1.7 වෙත යොමු වන්න |
| 1.5 | ඔබේ ග්‍රාමයේ පාසැලට නොයාමට හේතු කවරේ ද? | පාසැල ඇත්තේ 5 වසර දක්වා පමණයි<br>මගේ දරුවන්ට ඇතුල්වීම අනුමත වූයේ නැත<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3 | |
| 1.6 | ඔබේ දරුවා/දරුවන් ඉගෙනුම ලබන පාසැලේ නම කුමක් ද? | | | |
| 1.7 | ඔබට කිට්ටුතම පාසැල ඇත්තේ කී වැනි ශ්‍රේණිය දක්වා ද? | ශ්‍රේණිය 1-5<br>ශ්‍රේණිය 1-11 (අ.පො.ස. සා/පෙ)<br>ශ්‍රේණිය 1-13 (අ.පො.ස. උ/පෙ)<br>ශ්‍රේණිය 6-13 (අ.පො.ස. උ/පෙ) | 1<br>2<br>3<br>4 | පවුලේ වැඩි ප්‍රමාණයක් දරුවන් ඉගෙනුම ලබන පාසැල |
| 1.8 | පාසැල ඔබේ නිවසේ සිට කොපමණ දුර ද? | කි.මී. 1 ට අඩු<br>කි.මී. 1-3<br>කි.මී. 3-5<br>කි.මී. 5 ට වැඩි | 1<br>2<br>3<br>4 | |
| 1.9 | ඔබේ දරුවන් පාසැල් යන්නේ කෙසේ ද? | පයින් ඇවිද<br>බයිසිකලයෙන්<br>බසයෙන්<br>ත්‍රීරෝද රථයෙන්<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5 | |
| 1.10 | පාසැලේ සිසුවන් කී දෙනෙක් පමණ ඉගෙනුම ලබන්නේ ද? | 100-300<br>300-500<br>500-750<br>750-1000<br>1000 ට වැඩි | 1<br>2<br>3<br>4<br>5 | පිළිතුර නොදන්නේ නම් 999 |
| 1.11 | පාසැලේ ගුරුවරුන් කී දෙනෙක් පමණ සිටී ද? | 20 ට අඩු<br>20-30<br>30-45<br>45-55<br>වැඩි | 1<br>2<br>3<br>4<br>5 | පිළිතුර නොදන්නේ නම් 999 |
| 1.12 | අධ්‍යාපන සේවාව ලැබෙන්නේ නොමිලේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | 1.14 වෙත යොමු වන්න |
| 1.13 | එය නොමිලේ නොලැබීමට හේතුව කුමක් ද? | පෞද්ගලික පාසැල<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2 | |
| 1.14 | ඔබේ දරුවන්ට පාසැලෙන් ලැබෙන අධ්‍යාපනය | ගොඩාක් ප්‍රයෝජනවත් | 1<br>2 | |

| | | | | |
|---|---|---|---|---|
| | කෙතරම් ප්‍රයෝජනවත් ද? | යම්තාක් ප්‍රයෝජනවත්<br>වෙනත් (පැහැදිළි කරන්න) | 3 | |
| **1.15** | පාසැලෙන් ලැබෙනා අධ්‍යාපන සේවාව සෑහෙන බවට ඔබ විශ්වාස කරන්නේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| **1.16** | ඔබ එසේ සිතන්නේ ඇයි? | | | |
| **1.17** | නිවසේ දී ඉගෙනුමට දෙමාපියන් ගෙන් ලැබෙන පහසුකම් මොනවා ද?<br><u>(පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත)</u> | සෑහෙන්න ඉඩකඩ/පාඩම් කාමර<br>විදුලිය<br>අමතර පංති යාම<br>අමතර පංති සඳහා ප්‍රවාහන පහසුකම්<br>දෙමාපියන්ගේ අනුශාසනා<br>නිදහස් වටපිටාව<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5<br>6<br>7 | |
| **1.18** | ඔබගේ දරුවන් නිතර පාසැල් යන්නේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | <br>1.20 වෙත යොමු වන්න |
| **1.19** | නිතර පාසැල් නොයාමට හේතු කවරේ ද? | පවුලේ ආර්ථික පසුබිම<br>පාසැල දුරින් පිහිටීම<br>නිසි ප්‍රවාහනයක් නොමැතිකම<br>ඔහු/ඇය යාමට අකමැති වීම<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5 | |
| **1.20** | ඔබගේ දරුවා/දරුවන්ට වෙනත් විධි මගින් අධ්‍යාපන සේවාවන් ලැබේද? | නැත<br>ඔව් | 0 →<br>1 | 1.23 වෙත යොමු වන්න |
| **1.21** | ඔවුන් එම සේවාවන් ලබා ගන්නේ කෙසේ ද? | පෞද්ගලික පංති<br>ඒක පුද්ගල විශේෂ පංති<br>පිටස්තරින් (පාසැල් නොයා අධ්‍යාපන කටයුතු යෙදීම - විභාග සඳහා පෙනී සිටීම)<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br><br>3<br><br>4 | |
| **1.22** | ඔවුන් වෙනත් විධි මගින් අධ්‍යාපන සේවාවන් ලබා ගන්නේ ඇයි? | පාසැල් මගින් විෂය නිර්දේශය ආවරණය නොවීම<br>මගේ දරුවාට/දරුවන්ට ඉක්මනින් තේරුම් ගැනීමේ හැකියාවක් නොතිබීම (මන්දගාමී)<br>මගේ දරුවාට පාසැලකට ඇතුළුවීමට ඉඩක් නොමැතිවීම<br>වෙනත් (පැහැදිළි කරන්න) | <br>1<br><br>2<br><br>3<br>4 | |
| **1.23** | අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා වැඩියෙන්ම දායක වන අයතන(ය) කුමක් ද? | රාජ්‍ය අංශය<br>රාජ්‍ය නොවන අංශය<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3 | |

## 2 ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය

| | ප්‍රශ්නය | ප්‍රතිචාරය | සංකේතය | යොමුව |
|---|---|---|---|---|
| 2.1 | පාසැලේ සෑහීමට තරම් පංතිකාමර පහසුකම් තිබේද? | නැත<br>ඔව් | 0<br>1 | <br>→ 2.3 වෙත යොමු වන්න |
| 2.2 | ඔවුන් පංතිකාමර ඉඩකඩ සලසා ගන්නේ කෙසේ ද? | ගසක් යට<br>වෙනත් පංතියක් සමඟ ඒකාබද්ධව<br>එකම කාමරයක විවිධ පංති පැවැත්වීම<br>උදෑසන/සවස පංති<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5<br>6 | |
| 2.3 | පාසැලේ පොළොව හා බිත්ති සාදා ඇත්තේ කුමකින් ද? | අත්තිවාරම් සහිතව සම්පූර්ණයෙන්ම සිමෙන්තියන් වසා ඇත<br>අත්තිවාරම් සහිතව අර්ධ වශයෙන් සිමෙන්තියන් වසා ඇත<br>අත්තිවාරම් රහිත කොන්ක්‍රීට් කනු හා බෙලෙක් තහඩු<br>දැව හා බෙලෙක් තහඩු<br>දැව හා පොල් අතු<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5<br>6 | |
| 2.4 | පාසැල් ගොඩනැගිල්ලේ වහලය සාදා ඇත්තේ කුමක් භාවිතයෙන් ද? | උළු<br>ඇස්බැස්ටස්<br>ටකරං තහඩු<br>පොල් අතු<br>ඉටි රෙදි<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5<br>6 | |
| 2.5 | ගොඩනැගිල්ලේ ගුණාත්මකභාවය සෑහේද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.6 | මායිම් තාප්පය/වැට මහින් පාසැලේ මායිම සුරක්ෂිත ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.7 | වැසිකිළි පහසුකම් සෑහේද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.8 | ස්ත්‍රී හා පුරුෂ වෙන් වශයෙන් ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.9 | වැසිකිළි සඳහා ජල පහසුකම් සෑහේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.10 | වැසිකිළියේ තත්වය | පූතික ටැංකියක් සහිත ස්ථිර ගොඩනැහිල්ලක්<br>පෙහවුම් වල සහිත ස්ථිර ගොඩනැහිල්ලක්<br>පූතික ටැංකියක් සහිත අර්ධ-ස්ථිර ගොඩනැහිල්ලක්<br>පෙහවුම් වල සහිත අර්ධ-ස්ථිර ගොඩනැහිල්ලක්<br>තාවකාලික | 1<br>2<br>3<br>4<br>5 | |
| 2.11 | වැසිකිළි පහසුකම්හි ගුණාත්මකභාවය | සෑහේ<br>නොසෑහේ<br>දුර්වලයි<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.12 | පානීය ජල පහසුකම් තිබේද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.13 | ජලය ලබා ගන්නේ | ළිඳ<br>නල ළිඳ<br>නල ජලය (ටැංකියෙන්)<br>නල ජලය - පොදු සැපයුම<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4<br>5 | → 2.14 වෙත යොමු වන්න නැතහොත් 2.15 වෙත යොමු වන්න |

| | | | | |
|---|---|---|---|---|
| 2.14 | ළිඳ වටා ඇති ආරක්ෂාව සෑහේ ද? (බැම්ම හා ආවරණය) | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.15 | පානීය ජලයේ ගුණාත්මකභාවය | සෑහේ<br>නොසෑහේ<br>දුර්වලයි<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.16 | ගෘහභාණ්ඩ සියළුම සිසුවන් සඳහා සෑහේ ද? (ලියන මේස, පුටු, කළු ලෑලි, කබඩ්) | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.17 | පංතිකාමර තුළ අවශ්‍ය පරිදි වාතාශ්‍රය හා ආලෝකය තිබේද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.18 | දරුවා/දරුවන් හට පාසැලෙන් ආහාර ලැබේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.20 වෙත යොමු වන්න |
| 2.19 | ඔහුට/ඇයට ආහාර නොලැබෙන්නේ ඇයි? | | | 2.24 වෙත යොමු වන්න |
| 2.20 | ආහාර නිසි වේලාවට ලැබේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.21 | අවශ්‍ය පෝෂණය ආහාරයෙන් ලැබේ ද? (ප්‍රෝටීන්, විටමින් හා තන්තු) | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.22 | ආහාරය නිසියාකාරව සකසන්නේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.23 | සිසුන්ට ආහාර සපයන්නේ කෙසේ ද? | සිසුවාට ගත හැකිවන සේ පොදු ස්ථානයක තබා ඇත<br>ආහාර බෙදා දීම භාරව කෙනෙකු ඇත<br>එය ඔතා දෙන ලදී<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.24 | පාසැලට කැන්ටිමක් තිබේ ද? | නැත<br>ඔව් | 0 →<br>1 | 2.26 වෙත යොමු වන්න |
| 2.25 | කැන්ටිමේ ආහාර ගුණාත්මකභාවය කෙසේ ද? (මධ්‍යාහ්න ආහාරය අදාළ නොවේ) | හොඳයි<br>මධ්‍යකයි<br>දුර්වලයි | 1<br>2<br>3 | |
| 2.26 | පාසැලේ වෛද්‍ය පහසුකම් තිබේ ද? | නැත<br>ඔව් | 0 →<br>1 | 2.28 වෙත යොමු වන්න |
| 2.27 | පාසැලේ තිබෙන්නේ කුමන වර්ගයේ වෛද්‍ය පහසුකම් ද? | ප්‍රථමාධාර<br>විවේකය සඳහා වෙනම අංශයක්/ඉඩක්<br>හදිසි අවස්ථාක දී ප්‍රවාහන පහසුකම්<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.28 | ඔබගේ දරුවා/දරුවන් පාසැලේ දී වෛද්‍ය පරීක්ෂණයකට යොමු වූවා ද? | නැත<br>ඔව් | 0 →<br>1 | 2.31 වෙත යොමු වන්න |
| 2.29 | කුමණ මාදිළියේ වෛද්‍ය පරීක්ෂණ ද? | | | |
| 2.30 | පරීක්ෂණයෙන් පසු වෛද්‍ය වාර්තාවක් ලැබුනා ද? | නැත<br>ඔව් | 0<br>1 | |

| | | | | |
|---|---|---|---|---|
| 2.31 | ඔබේ දරුවාට පාඩම් පොත් නිසි වේලාවට ලැබුනා ද? | නැත<br>ඔව් | 0<br>1 | → 2.33 වෙත යොමු වන්න |
| 2.32 | ඔහුට/ඇයට විෂයන් සම්පූර්ණ කළ හැකිවන්නේ කෙසේ ද? | වෙනත් පාසැලක සිසුවන්ගෙන් ඉල්ලාගෙන<br>පාඩම් පොතේ ඡායාපිටපතක් ගෙන<br>පංති සටහන් මඟින්<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.33 | ඔබේ දරුවාට පාසැල් ඇඳුම සඳහා රෙදි ලැබුනා ද? | නැත<br>ඔව් | 0<br>1 | → 2.35 වෙත යොමු වන්න |
| 2.34 | ඔහුට/ඇයට එය නොලැබුනේ ඇයි? | | | 2.36 වෙත යොමු වන්න |
| 2.35 | රෙද්දෙ හි ගුණාත්මකත්වය සෑහේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.36 | පාසැලේ පුස්තකාලයක් තිබේ ද? | නැත<br>ඔව් | 0 →<br>1 | 2.38 වෙත යොමු වන්න |
| 2.37 | විමර්ශනය සඳහා ඇති පොත් සෑහේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.38 | පාසැලේ ක්‍රීඩා පිට්ටනියක් තිබේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.40 වෙත යොමු වන්න |
| 2.39 | ක්‍රීඩා උත්සව පවත්වන්නේ කොහේ ද? | සමීපතම පාසැල් ක්‍රීඩාපිටිය<br>ගමේ පිහිටි පොදු ක්‍රීඩාපිටිය<br>ක්‍රීඩා උත්සව නොපැවැත්වේ<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
| 2.40 | පාසැලේ ක්‍රීඩා උපකරණ තිබේ ද? | නැත<br>ඔව් | 0<br>1 | |
| 2.41 | පාසැලේ විද්‍යාගාරයක් තිබේ ද? | නැත<br>ඔව් | 0 →<br>1 | 2.45 වෙත යොමු වන්න |
| 2.42 | විද්‍යාගාරය සිසුවන් සඳහා විවෘත ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.44 වෙත යොමු වන්න |
| 2.43 | එසේ විවෘත නොවන්නේ ඇයි? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත) | උපකරණ හිඟතාවය<br>විද්‍යාගාර සහායකයකු නොමැතිකම<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3 | 2.45 වෙත යොමු වන්න |
| 2.44 | විද්‍යාගාර පහසුකම් සිසුන්ට සෑහේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.46 වෙත යොමු වන්න |
| 2.45 | සිසුවන් ප්‍රායෝගික විද්‍යාව පුහුණුවන්නේ කෙසේ ද? | සමීපතම පාසැල් විද්‍යාගාරයෙන්<br>ප්‍රායෝගික විද්‍යාවේ නොයෙදේ<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3 | |
| 2.46 | පාසැලේ පරිඝණකාගාරයක් තිබේ ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.50 වෙත යොමු වන්න |
| 2.47 | එය සිසුවන් සඳහා විවෘත ද? | නැත<br>ඔව් | 0<br>1 → | 2.49 වෙත යොමු වන්න |
| 2.48 | එසේ විවෘත නොවන්නේ ඇයි? (පිළිතුරු කිහිපයක් දීමට අවස්ථා ඇත) | විදුලිය නොමැතිකම<br>පරිඝණක හිඟතාවය<br>තොරතුරු තාක්ෂණ ගුරුවරයෙකු නොමැතිකම<br>වෙනත් (පැහැදිළි කරන්න) | 1<br>2<br>3<br>4 | |
